

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

சுகததாச தேசிய விளையாட்டுக் கட்டிடத்தொகுதி அதிகாரசபை

SUGATHADASA NATIONAL SPORTS COMPLEX AUTHORITY

# 2014

# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# Annual Report

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

# වාර්ෂික වාර්තාව
# 2014

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය


1. තොරතුරු සම්බන්ධීකරණය .......... 03
2. ක්‍රීඩාංගණ පාලක කළමනාකාරීත්වය .......... 03
3. අපගේ දර්ශණය සහ අපගේ මෙහෙවර .......... 04
4. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිහිටුවීම .......... 05
5. ආයතනයේ සංවිධාන ව්‍යුහය .......... 06
6. අනුමත කාර්ය මණ්ඩලය .......... 07
7. මෙම අධිකාරියේ වගකීම් හා කාර්යයන් .......... 08
8. කළමනාකරණය .......... 09
9. පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර .......... 10
10. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය .......... 19
    - ගෘහස්ථ ක්‍රීඩාගාරය .......... 20
    - උප ක්‍රීඩාගාරය .......... 22
    - පිහිණුම් තටාක සංකීර්ණය .......... 23
    - කායවර්ධන මධ්‍යස්ථානය .......... 24
    - ක්‍රීඩා හෝටලය .......... 25
11. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය ....... 26
12. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය .......... 28
13. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය ....... 30
14. ආර්. ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගණය .......... 31
15. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය .......... 32
16. බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක .......... 35
17. නුවරඑළිය තුරඟ තරඟ පිටිය .......... 36
18. ආයතනයේ සමස්ථ ප්‍රගතිය .......... 37
19. ගිණුම්කරන ප්‍රතිපත්ති .......... 38
20. ආදායම් වියදම් ප්‍රකාශය .......... 42
21. ශේෂ පත්‍රය .......... 44
22. අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය .......... 45
23. විගණකාධිපති වාර්ථාව .......... 46

# තොරතුරු සම්බන්ධීකරණය

## ආයතනයේ නම - සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ප්‍රතිස්ථාපනය කිරීම නීතිමය වශයෙන් 1999 අංක 17 දරණ පාර්ලිමේන්තු පනත මඟින් නීතිගත කර ඇත.**

### කළමණාකාරීත්ව මණ්ඩලය

නීතීඥ පණ්ඩුක කීර්තිනන්ද මහතා - සභාපති
එම් ඩී ජේ සී මුරගේ මහතා - සාමාජික
(සහකාර අධ්‍යක්ෂ ,වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තුමේන්තුව)
එම් ඩී රංජනී ජයකොඩි මහත්මිය - සාමාජික
(අධ්‍යක්ෂ ජෙනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව)
ශාන්ත වීරසිංහ මහතා - සාමාජික
(අධ්‍යක්ෂ සංවර්ධන, ක්‍රීඩා අමාත්‍යාංශය)
මනූ චන්මුගම් මහතා - සාමාජික
පියාසර කොමදෝරු බුවනෙක දේශප්‍රිය - සාමාජික
සහකාර පොලිස් අධිකාරී පී නිසල් රත්නායක - සාමාජික
මනුල චමල් පෙරේරා මහතා - සාමාජික
එච් එම් එම් එස් බංඩාර හේරත් මහතා - සාමාජික
ආර් පී ඒ ඩී බී සමරනායක මහතා - සාමාජික
වෛද්‍ය ඩී සාරංග අලහප්පෙරුම මහතා - සාමාජික
නීතීඥ අයි ආර් පී ද සිල්වා මහතා - ලේකම්

**බැංකුව**

ලංකා බැංකුව - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව

**විගණනය**

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක : 306/7, පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ලිපිනය**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
තැ.පෙ. 2211, ආතර් ද සිල්වා මාවත,
කොළඹ 13.

දුරකථන : 011 - 2445677, 2422841
011 - 2384490, 2384385
ෆැක්ස් : 011 - 2445675
විද්‍යුත් තැපැල : sugathad@sltnet.lk

### විගණන හා කළමණාකරන කමිටුව

එම් ඩී ජේ සී මුරගේ මහතා - සභාපති
(සහකාර අධ්‍යක්ෂ ,වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තුමේන්තුව)
මනූ චන්මුගම් මහතා - සාමාජික
පියාසර කොමදෝරු බුවනෙක දේශප්‍රිය - සාමාජික
එම් එම් ජේ මෙලානි මහත්මිය - සාමාජික
ටී එල් ටී මධුෂානි රණවීර මෙනවිය - ලේකම්

නිරීක්ෂණ මට්ටමින් වූ සහභාගිත්වය
ජී එච් ඩී ධර්මපාල මහතා (විගණන අධිකාරී)

**ක්‍රීඩා සංකීර්ණ පාලක මණ්ඩලය**

නීතීඥ පණ්ඩුක කීර්තිනන්ද මහතා - සභාපති
ලුතිනන් කර්නල් එල්එච්එම් රාජපක්ෂ, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී
- අධ්‍යක්ෂ (2014-04-01 දක්වා)
ලුතිනන් කර්නල් එම්එල් ප්‍රනාන්දු - අධ්‍යක්ෂ (2014-05-02 දක්වා)
චමින්ද කේ උඩකුඹුර මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.බ.)
(2014-06-02 සිට 2014-09-02 දක්වා)
ආර්එස්එම් බණ්ඩාර වැත්තෑව මහතා - සහකාර අධ්‍යක්ෂ (මුදල්)
ලුතිනන් කර්නල් ඊඑම්යූ ඒකනායක ආර්එස්පී, යූඑස්පී (2014-03-17 දක්වා)
- සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා)
ඩබ්ලිව්එම්වයිජ් විජේසූරිය මෙනවිය - සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා)
එම්එම් අජිත් රණසිංහ මහතා - සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණික)
ටීඑල්ටීඑම් රණවීර මෙනවිය - විගණක නිළධාරී
කේ බන්දුතිලක මහතා - කළමනාකරු (තො.තා)
පීඩීඑන් ප්‍රභා කිරිඇල්ල මහත්මිය - කළමනාකරු (එළිමහන්)
පීඩී සම්පත් පෙරේරා මහතා - කළමනාකරු (ගෘහස්ථ)
කේජීජී නිල්මිණී කිරිඇල්ල මහත්මිය - කළමනාකරු (පාලන)
මේජර් එච්ජී උපාලි ගමගේ - කළමනාකරු (ආරක්ෂක)
සම්පත් නයිදූවාවඩු මහතා - කළමනාකරු (ගෘහස්ථ)
ශානිකා ප්‍රභාෂ්වරී මෙනවිය - අලෙවි නිළධාරී
මේජර් ඩබ්ලිව්එම්එම්ඩබ්ලිව්බීඑච්ජී පිටවල ආර්එස්පී
- කළමනාකරු (බෝගම්බර)

# අපගේ දර්ශනය සහ මෙහෙවර



## දැක්ම

ආසියාවේ පළමු පෙලේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පහසුකම් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බවට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පත්කිරීම සහ එය සතු අනෙකුත් ක්‍රීඩා සංකීර්ණ දියුණු කිරීම තුලින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනයට පහසුකම් සහනදායීව ලබාදීම.

## මෙහෙවර

ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම මගින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුවට දායකවීම සහ ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා ඔප් නැංවීමට ඇවැසි පහසුකම් සහිත ආසියානු කලාපයේ ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සහිත ප්‍රමුඛතම ජාත්‍යන්තර සංකීර්ණයක් බවට පත්වීම.


# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිහිටුවීම



**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය භාරකාර අරමුදලක් ලෙස 1995-02-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගනු ලැබූ අතර, 1999 අප්‍රේල් මස 20 වන දින සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියක් බවට පත්කිරීමේ 1999 අංක 17 දරණ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එකී පනත 1999-09-01 දින සිට බලපාන සේ සම්මතවූ අතර, එදින සිට මෙම ජාතික ක්‍රීඩා සංකීර්ණය, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ලෙස ස්ථාපිත කරන ලදී.**

**මෙම අධිකාරියේ කළමනාකරණ කටයුතු ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරන කළමනාකාරීත්ව මණ්ඩලයක් මගින් සිදුකරන අතර, එම මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.**

1. සභාපති - ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ.
2. ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ නියෝජිතයෙකු.
3. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනත යටතේ පත්කරනු ලබන ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්.
4. භාණ්ඩාගාරයේ නියෝජිතවරයෙකු.
5. මීට අමතරව ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් 07 දෙනෙකු .


සභාපති
අධ්‍යක්ෂ (1)
නියෝජ්‍ය අධ්‍යක්ෂ
HM 1-1 1
MM 1-3 1
HM 1-3 4
MA-3 10
MA 2-1 4
MA 1-1 63
PL-3 7
PL-2 17
PL-1 220
327

# අනුමත කාර්යය මණ්ඩලය

කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්ට අමතරව ආයතනයේ අනුමත බඳවාගැනීමේ පරිපාටියේ පරිදි ස්ථිර මුළු සේවක සංඛ්‍යාව 326ක් වේ. 2014-12-31 දිනට එම අනුමත සේවක සංඛ්‍යාවෙන් ආයතනයේ සේවය කළ සංඛ්‍යාව 88% ක් වේ. එය පහත සඳහන් පරිදි සවිස්තරාත්මකව දැක්විය හැක.

| අංක | තනතුර | වැටුප් කාණ්ඩය | 2014.12.31 දිනට සේවක | අනුමත ස්ථිර සේවක | පුරප්පාඩු අතිරික්තය |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ | HM 1-1 | 01 | 01 | - |
| 02 | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | MM 1-3 | 04 | 05 | 01 |
| | ආශ්‍රිත නිළධාරීන් | | | | |
| 03 | විගණක නිළධාරී | MA - 3 | 01 | 01 | - |
| 04 | තොරතුරු තාක්ෂණ නිළධාරී | | 01 | 01 | - |
| 05 | නඩත්තු නිළධාරී | | - | 01 | 01 |
| 06 | ක්‍රීඩාංගණ කළමණාකරු | | 03 | 04 | 01 |
| 07 | මිලදීගැනීම් නිළධාරී | | - | 01 | 01 |
| 08 | අලෙවි නිළධාරී | | 01 | 01 | 01 |
| 0෧ | කළමණාකරු - ආරක්ෂක | | 01 | 01 | - |
| | කළමණාකරන සහකාර (තාක්ෂණික) | | | | |
| 10 | කාර්මික සහකාර | MA 2-1 | 01 | 02 | 01 |
| 11 | ගබඩා භාරකරුවන් | | - | 01 | 01 |
| 12 | පොත් තබන්නන් | | 01 | 01 | - |
| | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) | | | | |
| 13 | කළමනාකරණ සහකාර | MA 1-1 | 31 | 31 | 00 |
| 14 | පිට්ටනි සැළසුම්කරු | | 01 | 01 | - |
| 15 | වැඩ පරීක්ෂක | | 02 | 02 | - |
| 16 | ක්‍රීඩා පුහුණුකරු / ක්‍රීඩා නිළධාරී | | 07 | 09 | 02 |
| 17 | ආරක්ෂක නිළධාරී / ප්‍රධාන ආරක්ෂක නිළධාරී | | 13 | 20 | 07 |
| | ප්‍රාථමික ශිල්පීන් | | | | |
| 18 | විදුලි කාර්මික | PL - 3 | 01 | 01 | -- |
| 19 | රියදුරු | | 06 | 06 | (01) |
| | ප්‍රාථමික අර්ධ ශිල්පීන් | | | | |
| 20 | වඩු කාර්මික, පෙදරේරු, පයිප්ප වැද්දුම්කරු, පින්තාරුකරු සහ පෑස්සුම්කරු | PL - 2 | 13 | 15 | 02 |
| 21 | බයිසිකල් පණිවිඩකරු | | 02 | 02 | 00 |
| | ප්‍රාථමික අර්ධ ශිල්පීන් නොවන | | | | |
| 22 | ක්‍රීඩාංගණ සහායක | PL - 1 | 110 | 110 | 00 |
| 23 | කාර්යාල කාර්ය සහායක | | 10 | 10 | - |
| 24 | ආරක්ෂක නියාමක | | 98 | 100 | 02 |
| | එකතුව | | 308 | 327 | 18 |

# අධිකාරියේ වගකීම් සහ කාර්යයන්

**වගකීම්**

1. කලමනාකරණය කිරීම, නඩත්තු කිරීම සහ ජාතික වත්කමක් ලෙස සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

2. සියළු පහසුකම් සහ සේවා නඩත්තු කරගෙන යාම.

3. ගොඩනැගිලිවලට හා ව්‍යුහවලට අවශ්‍යවන වැඩි දියුණුකිරීම් හෝ වෙනස් කිරීම් සිදු කිරිම.

4. ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට හා විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට ක්‍රීඩාවෙහි ස්වකීය හැකියාව වැඩි දියුණු කර ගැනීම සහ ඔවුන්ගේ කායවර්ධන හා සෞඛ්‍යය වැඩි දියුණු කර ගැනීමට හැකිවනසේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව පහසුකම් ඔවුනට ලබාදීම.

5. විශේෂයෙන්ම ග්‍රාමීය අංශවල ක්‍රීඩා වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව ක්‍රීඩා පිළිබඳ පුහුණු පාඨමාලා සහ වැඩසටහන් පවත්වාගෙන යාම.

6. ජාතික හා අන්තර්ජාතික උත්සව සඳහා අවශ්‍ය පහසුකම් කලමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව ලබාදීම.

7. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ විනෝදාත්මක පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව ජාත්‍යන්තර සහ දේශීය ක්‍රීඩා පුහුණු සංවිධානය, ක්‍රීඩා ආයතන සමඟ සම්බන්ධීකරණය සහ සම්බන්ධතා ඇතිකරගැනීම.

8. අප අධිකාරියේ පහසුකම් කලමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව සාධාරණ ගාස්තුවකට පාසැල්වලට, තරුණ ක්‍රීඩා සමාජවලට සහ ක්‍රීඩා සංවිධානවලට සැපයීම.

**කාර්යයන්**

1. ඉහත වගකීම් ඉටු කරනු වස් අප අධිකාරිය විසින් පහත ක්‍රියාමාර්ග ගනු ලබන අතර ජාතික ක්‍රීඩා සංගම්, පාසල් ක්‍රීඩා සංගම් හා රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතන සඳහා කළමනාකාරීත්ව මණ්ඩලය මගින් අනුමත කල සහනදායී ගාස්තු යටතේ සේවා හා පහසුකම් සපයනු ලැබේ.

2. ජාතික හා ජාත්‍යන්තර ජවන හා පිටිය ක්‍රීඩා තරග සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

3. ජාත්‍යන්තර මට්ටමේ තරග දිවා කාලයේදී මෙන්ම රාත්‍රී කාලයේදී පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

4. අඩු පහසුකම් සහිත පාසැල් හා ග්‍රාමීය මට්ටමේ දක්ෂතා සපිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සපයාදීම මගින් ඔවුන්ගේ දක්ෂතා වැඩිදියුණු කරගෙන ඉදිරියට ඒමට අවශ්‍ය පහසුකම් සැපයීම

5. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරග පැවැත්වීමට අවශ්‍ය පිහිණුම් හා කිමිදුම් තටාකාංගන පහසුකම් සැපයීම.

6. විහාග, සම්මන්ත්‍රණ ,සමුළු හා උත්සව, විනෝද කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

7. පුහුණු වැඩමුළු සංවිධානය කිරීම

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

# කළමනාකරණය

# පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර

දිවා කාලයේ මෙන්ම රාත්‍රී කාලයේදී ද පහසුකම් සහ සේවා සැපයීමේ සුවිශේෂී හැකියාවන් සතු සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ක්‍රීඩා , සෞඛ්‍ය, අධ්‍යාපන මෙන්ම විනෝදාස්වාද යන ක්ෂේත්‍ර සඳහා පහසුකම් සහ සේවා සැපයීමෙන් ජාතික වශයෙන් අති විශාල දායකත්වයක් දරයි. විශේෂයෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීමේ ප්‍රමුඛතම ආයතනය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියයි.

**ක්‍රීඩා**

මලල ක්‍රීඩා , රගර්, දැල්පන්දු, ක්‍රිකට්, පැසිපන්දු, ස්කොෂ්, අත්පන්දු, වොලිබෝල්, බැඩ්මින්ටන්, මේසපන්දු, ජූඩෝ, මල්ලවපොර, වුෂු, බොක්සිං, ටයිකොන්ඩෝ, කරාතේ, ජිම්නාස්ටික් යනාදී ක්‍රීඩා සඳහා ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම.

**සෞඛ්‍ය හා අධ්‍යාපන**

ජාතික සහ ජාත්‍යන්තර උත්සව, වැඩමුළු, පුහුණු පාඨමාලා, කායවර්ධන පාඨමාලා, පිහිණුම් හා ජීවිතාරක්ෂක පාඨමාලා, සංදර්ශන, රැස්වීම් සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීම.

**විනෝදාස්වාදය**

ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ මහා පරිමාණ සංදර්ශන සඳහා සේවා හා පහසුකම් සැපයීම.

**වෙළඳ ප්‍රචාරණ හා දැන්වීම්**

අලෙවිකරණයට අදාළ නිශ්චල ඡායාරූප ගැනීමට සහ වීඩියෝ පට සඳහා අවශ්‍ය පසුතල ලබාදීම මගින් සේවා සහ පහසුකම් සැපයීම. අතිශයින් ජනප්‍රිය වෙළඳ දැන්වීම් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ආශ්‍රිතව රූගත කර ඇති බව සඳහන් කළ යුතුව ඇත.

## ඉහත සේවා සහ පහසුකම් සැපයීම සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පහත සඳහන් ආයතනවලින් සමන්විත වේ.

1. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය හා පිහිණුම් තටාක සංකීර්ණය
2. සුගතදාස ක්‍රීඩා හෝටලය
3. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය
4. ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය
   (2006-11-01 දින සිට වසර තිහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදුදී ඇත)
5. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය
6. බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක
7. නුවරඑළිය තුරඟ තරඟ පිටිය

2014 මූල්‍ය වර්ෂය තුළ සේවක අභිප්‍රේරණය සහ කුසලතා වර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලද වර්ෂයකි. එම වර්ෂය තුළ පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අනුකූලව පුහුණු පාඨමාලා සහ වැඩසටහන් ලබාදීමට ඉහළ පාලන අධිකාරිය කටයුතු කර ඇත.

| අ.අ. | පාඨමාලාව | කාලසීමාව | සහභාගීත්වය | මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | ප්‍රවාහන කළමනාකරණය | 2014 මාර්තු 04 - 05 | 01 | 5,500.00 |
| 02 | සරප්/ මුදල් අයකැමි තනතුරේ කාර්ය හා වගකීම් | 2014 පෙබරවාරි 20 | 01 | 4,500.00 |
| 03 | Stress Management | 2014 මාර්තු 20 | 02 | 8,000.00 |
| 04 | ගිනි නිවීමේ උපකරණ භාවිතා කිරීම | 2014 මැයි 22 | 25 | 12,735.00 |
| 05 | රියදුරු සහ කාර්යාල කාර්ය සහායක | 2014 මැයි 31 | 02 | 10,000.00 |
| 06 | කායවර්ධන පුහුණු පාඨමාලාව | 2014 ජූනි 11 | 01 | 10,500.00 |
| 07 | Motivation Worker Satisfaction | 2014 ජූනි 27 | 01 | 3,000.00 |
| 08 | විද්‍යාත්මක පිරිමැසුම් දායක සහ ආරක්ෂිත රිය පැදවීම | 2014 ජූනි 27 | 02 | 5,000.00 |
| 09 | කාර්යාල කාර්ය සහායක සහ රියදුරු | 2014 ජූනි 28 | 02 | 10,000.00 |
| 10 | Public Procument Procedure | 2014 ජූලි 28, 29 | 01 | 8,500.00 |
| 11 | Disciplinary Inquiries | 2014 ජූලි 31 | 01 | 8,500.00 |
| 12 | Methodical way of maintain Accounting Books | 2014 ජූලි 30, 31 | 02 | 17,000.00 |
| 13 | පුද්ගලික ලිපි ගොනු සහ නඩත්තු | 2014 ජූලි 10, 11 | 01 | 8,500.00 |
| 14 | නිවාඩු ලිපිකරුගේ කාර්ය භාරය සහ වගකීම් | 2014 අගෝස්තු 14, | 02 | 17,000.00 |
| 15 | ගබඩා කළමනාකරණය සහ ප්‍රසම්පාදන | 2014 අගෝස්තු 28, | 03 | 25,500.00 |
| 16 | පොත් තැබීම | 2014 අගෝස්තු 28 | 01 | 5,000.00 |
| 17 | පරිපාලන විධික්‍රම සහ මානව සම්පත් කළමනාකරණය | 2014 සැප්තැම්බර් 18 | 02 | 6,000.00 |
| 18 | සරප්/ මුදල් අයකැමි තනතුරේ කාර්ය භාරය | 2014 සැප්තැම්බර් 26 | 02 | 10,000.00 |
| 19 | පරිගණක දෘඩාංග | 2014 සැප්තැම්බර් 28 | 01 | 31,000.00 |
| 20 | කාර්යාල කළමනාකරණය සහ මුදල් රෙගුලාසි | 2014 සැප්තැම්බර් 29, 30 | 03 | 25,500.00 |
| 21 | රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරී ආයතන සේවක නිවාඩු | 2014 ඔක්තෝබර් 23 | 01 | 5,000.00 |
| 22 | කාර්යාල කළමනාකරණය සහ මුදල් රෙගුලාසි | 2014 ඔක්තෝබර් 11, 12 | 03 | 25,500.00 |
| 23 | විදුලි උපාංග (MEC) | 2014 නොවැම්බර් 24 | 02 | 30,000.00 |
| 24 | ඊ රාජ්‍ය සංකල්පය සහ කාර්යාල තොරතුරු වැඩමුළුව | 2014 නොවැම්බර් 24, 26 | 07 | 59,500.00 |
| 25 | රාජ්‍ය සේවයේ රියදුරු සහ කණිෂ්ඨ නිලධාරී | 2014 නොවැම්බර් 28 | 05 | 25,000.00 |
| | **එකතුව** | | | **376,735.00** |

### කළමනාකාරීත්ව වාර්තාකරණය

ආයතනික මාසික ප්‍රගතිය ක්‍රීඩා අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම අඛණ්ඩව මාසිකව සිදුකරන අතර තුන්වන කාර්තුව අවසානයේ පාර්ලිමේන්තු සභාගත කරනු ලබන කාර්ය සාධන වාර්තාව නිසි පරිදි ඉදිරිපත් කිරීමටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, අයවැය දෙපාර්තමේන්තුව, ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව යන ආයතන වෙත සංඛ්‍යාංක දත්ත ඉදිරිපත් කිරීමටත් කටයුතු කර ඇත.

### 2014 වර්ෂයට අදාල කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම්

මෙම අධිකාරියේ අභිවෘද්ධියට අදාල තීන්දු තීරණ ගැනීම කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සිදුකරන අතර ඊට අදාල රැස්වීම් මාසිකව පැවැත්වේ. 2014 වර්ෂයට අදාලව කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා ඇති අතර එම රැස්වීම්වලදී ලබාගත් වැදගත් තීරණ මතු පරිදි ඉදිරිපත් කළ හැක.

| අ.අ. | දිනය | කාරණය | විස්තරය |
|---|---|---|---|
| 01. | 2014.01.21 | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ සේවය කරන ආරක්ෂක නිළධාරීන් හා ක්‍රීඩාංගණ සහායකයින්හට වෘත්තීය පුහුණුව ලබාදීම | අධිකාරියේ සේවය කරනු ලබන පෙදරේරු, වඩුකාර්මික, ජලනල කාර්මික හා විදුලි යාන්ත්‍රික වෘත්තීය සුදුසුකම් / අධ්‍යාපන සුදුසුකම් ඇති ආරක්ෂක නිළධාරීන් හා ක්‍රීඩාංගණ සහායකයින් අතුරෙන් අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණ පවත්වා ඔවුනට වෘත්තීය පුහුණු අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන පාඨමාලා වෙත යොමුකර වැඩි දැනුමක් / පුහුණුවක් ලබාදීම |
| 02. | | සේවක ව්‍යුහය ප්‍රතිව්‍යුහගතකරණය සහ වැටුප් සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම සඳහා ස්වාධීන බාහිර පාර්ශවයක උපදේශන සේවය ලබාගැනීම | අධිකාරියේ දැනට අනුමත සේවක ව්‍යුහය තුළ අඩුපාඩු රැසක් තිබෙන බව හා වැටුප් පරිමාණය තීරණය කිරීමේදී ගැටළුකාරී තත්වයක් ඇතිවී තිබෙන බවද නිරීක්ෂණය වී ඇතිබැවින් මෙම තත්වය නිරාකරණය කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්ට අනුව රාජ්‍ය පරිපාලන සේවයේ නිළධාරියෙකුගේ සේවය ලබා ගැනීම සුදුසු බව කළමනාකාරීත්ව මණ්ඩලය තීරණය කරන ලදි. |
| 03. | | ඩයලොග් විදුලි සංදේශ කුළුණු සවිකිරීම - සුගතදාස ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩාංගණ | ඩයලොග් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති මූලික වානිජ්‍ය කොන්දේසි පිළිබඳ දැනටමත් ඩයලොග් ආයතනයේ අදාල නියෝජිතයින් සමග සාකච්ඡා කර ඇති බවත් ඒ සම්බන්ධව යහපත් ප්‍රතිචාරයක් ලැබී ඇති බවත් සභාපතිතුමා විසින් කළමනාකාරීත්ව මණ්ඩලය වෙත දන්වා සිටින ලදි. |
| 04. | | බෝගම්බර ක්‍රීඩාංගණයේ කායවර්ධන මධ්‍යස්ථානය සඳහා වෙන්කිරීම් ගාස්තු තීරණය කිරීම (භෞත චිකිත්සක - ක්‍රීඩා සඳහා) | මෑතකදී විවෘත කරන ලද බෝගම්බර ක්‍රීඩාංගණයේ කාය වර්ධන මධ්‍යස්ථානයේ භෞත චිකිත්සක (ක්‍රීඩා) සේවාව ලබාදීම වෙනුවෙන් පැයකට රු.1,000/- (සියළු බදු මුදල් සහිතව) ගාස්තුවක් අයකිරීමට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. |
| 05. | 2014.02.26 | බෝගම්බර ක්‍රීඩාංගණයේ ප්‍රවාහන අවශ්‍යතා සඳහා ත්‍රීරෝද රථයක් මිළදී ගැනීම | බෝගම්බර ක්‍රීඩාංගනයේ ප්‍රවාහන අවශ්‍යතා සඳහා ත්‍රීරෝද රථයක් මිළදී ගැනීම මහා භාණ්ඩාගාර අනුමැතියට යටත්ව සිදුකිරීමට කළමනාකාරීත්ව මණ්ඩලය විසින් අනුමැතිය දෙන ලදී. |
| 06. | 2014.03.25 | සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ සවිකර ඇති නව වායු සමීකරණ පද්ධතිය සඳහා වෙන්කිරීම් ගාස්තු අයකිරීම සම්බන්ධව | සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ නව වායු සමීකරණ පද්ධතිය විශේෂ උත්සව අවස්ථාවන් සඳහා භාවිතා කරනු ලබන අතර, මේවනවිට එහි ක්‍රියාකාරීත්වය සඳහා ස්ථාවර විදුලි සැපයුම ලබාදී ඇති බැවින්, වෙන් කිරීම් සඳහා අයකරනු ලබන පහත දක්වා ඇති සංශෝධිත ගාස්තුව 2014-03-15 වන දින සිට ක්‍රියාත්මක කිරීමට කළමනාකාරීත්ව මණ්ඩලය විසින් අනුමත කරන ලදී.<br><br>පැය 05ක් සඳහා අයකරනු ලබන ගාස්තුව - රු 450,000/- (බදු මුදල් රහිතව)<br>අමතර පැයක් සඳහා අයකරනු ලබන ගාස්තුව - රු 80,000/- (බදු මුදල් රහිතව) |

| අ.අ. | දිනය | කාරණය | විස්තරය |
|---|---|---|---|
| 07. | | කාර්යය මණ්ඩලයට රක්‍ෂණාවරණයක් ලබාදීම (හදිසි අනතුරු) | මීට පෙර හදිසි අනතුරු අවස්ථා වලට මුහුණදී ඇති සේවකයින් සිටියද ඔවුනට ආයතනයෙන් මාසික වැටුප හැර වෙනත් ප්‍රතිලාභයක් ලබාදී නොමැති බැවින් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ කාර්යය මණ්ඩලයට හදිසි අනතුරු වලදී සිදුවන ආපදා සඳහා රක්‍ෂණාවරණයක් ලබාදීම සුදුසු බව සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. ඒ අනුව රක්‍ෂණ සමාගම් කිහිපයකින් ලබාදී තිබූ මිළ ගණන් පත්‍ර කළමනාකාරීත්ව මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, ලබාදී තිබූ මිළ ගණන් පිළිබඳ සාකච්ඡා කරන ලදී. මෙහිදී සෙලින්කෝ සමාගම විසින් අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබුණද, කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පවසා සිටින ලද්දේ රක්‍ෂණ පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් නිකුත් කර ඇති චක්‍ර ලේඛණයන්හි උපදෙස් අනුගමනය කරන ලෙසත්, රාජ්‍ය අනුබද්ධිත රක්‍ෂණ සමාගමක් වන ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවෙන් මෙම කාර්යය සිදුකර ගැනීමටත් අවශ්‍ය ඉදිරි කටයුතු කරන ලෙසත්‍ය. මේ සම්බන්ධව ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව සමඟ සාකච්ඡා කර අවම මිළ ගණන් පත්‍රයක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස කළමනාකාරීත්ව මණ්ඩල සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී. |
| 08. | 2014.04.29 | කායවර්ධන මධ්‍යස්ථානය හා දුණු විදීමේ පුහුණුවීම් සඳහා වෙන්කිරීම් ගාස්තු අනුමත කර ගැනීම. | (1) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ කායවර්ධන මධ්‍යස්ථානය ජාතික ක්‍රීඩා කණ්ඩායම් සඳහා පහත දක්වා ඇති ගාස්තු අයකිරීමේ පදනම මත එම පහසුකම ලබාදීමට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී.<br><br>ජාතික ක්‍රීඩා කණ්ඩායම් වලට කායවර්ධන මධ්‍යස්ථානය පැය 03ක කාලයක් සඳහා - රු 3,500/- (බදු මුදල් රහිත)<br><br>වෙන්කිරීමට අමතරව ලබාගන්නා කාලය වෙනුවෙන් (පැයක කාලයක් සඳහා) - රු1,000/- (බදු මුදල් රහිත)<br><br>(2) දුණුවිදීමේ සංගමය සඳහා පුහුණුවීම් කටයුතු සිදුකිරීමට සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ පහසුකම් පැය 03ක කාලයක් ලබාදීම වෙනුවෙන් රු 100/- ක මුදලක් (බදු මුදල් රහිතව) අයකර ගැනීමටද කළමනාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය දෙන ලදී. |
| 09. | 2014.06.23 | ගෘහස්ථ ක්‍රීඩාංගණයේ WiFi පද්ධතියක් සවිකිරීම | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් ලබාදී ඇති විස්තරවලට අනුව උසස්‍ස පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා රු.1,387,496.77 ක මුදලක් වැයවන අතර, මාසික කුලිය සම්බන්ධතා 02ක් සඳහා රු 7,500/- ක් (බදු රහිත) වේ.<br><br>ශ්‍රී ලංකා ටෙලිකොම් රජයේ නිල සන්නිවේදන ආයතනය වන බැවින් හා අවම මාසික බදුකුලී මුදලක් අයකරන බැවිනුත් WiFi පද්ධතිය ශ්‍රී ලංකා ටෙලිකොම් වෙතින් ලබාගැනීමට හා ඉදිරි කටයුතු සිදුකිරීමට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. |
| 10. | | (1) සුමති ප්‍රේක්‍ෂකාගාරය නවීකරණය හා බදුදීම සම්බන්ධව කටයුතු කිරීම<br><br>(2) අශ්වගාලක් (Stable) සඳහා දැනට අයකරනු ලබන මාසික කුලිය සංශෝධනය කිරීම | රැස්වීම් අංක 06/2014 (2014-06-23) නුවරඑළිය තුරඟ තරඟ පිටියට අයත්ව ඇති සුමති ප්‍රේක්‍ෂකාගාරය දිගින් අඩි 83 ක් හා පළලින් අඩි 27 ක් යුත් දෙමහල් ගොඩනැගිල්ලකි. මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර සුදුසු ආයතනයකට දිගු කාලීන බදු පදනම මත ලබාදීම සඳහා හැකි බව සභාපතිතුමා විසින් යෝජනා කර සිටින ලදී. ඒ අනුව මෙම ගොඩනැගිල්ල ශ්‍රී ලංකා තුරඟ තරඟ සංගමයට බදු පදනම මත ලබාදිය හැකි බවත්, අඩ්ල අළුත්වැඩියා කටයුතු එම සංගමය මඟින්ම හෝ ටෙන්ඩර් දැන්වීම් මඟින් සිදුකිරීමට හැකි බවත් වැඩිදුරටත් දන්වා සිටින ලදී.<br><br>ශ්‍රී ලංකා තුරඟ තරඟ සංගමය දැනටමත් නුවරඑළිය තුරඟ තරඟ පිටියේ කාර්යයන්හි නිරතව ඇති බැවින් එම සංගමයටම සුමති ගොඩනැගිල්ල දිගුකාලීන බදු පදනම මත ලබාදීමට කළමනාකාරීත්ව මණ්ඩලය අනුමැතිය ලබාදෙන ලදී. |

| අ.අ. | දිනය | කාරණය | විස්තරය |
|---|---|---|---|
| | | | නුවරඑළිය තුරඟ තරඟ පිටියේ චීන රජයේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අවශ්‍ය සාකච්ඡා සිදුකරමින් පවතින බැවින් මේ සම්බන්ධව ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය දැනුවත් කරන ලෙසද කළමනාකාරීත්ව මණ්ඩලය සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.<br><br>2014-07-01 වන දින සිට අශ්වගාලක් (Stable) සඳහා අයකරනු ලබන මුදල රු300/- (බදු රහිව) අයකිරීමට කළමනාකාරීත්ව මණ්ඩලය අනුමැතිය දෙන ලදී. |
| 11. | | සුගතදාස පිහිණුම් තටාක සංකීර්ණයේ ෆයිබර් ග්ලාස් පුටු අළුත්වැඩියා කිරීම සම්බන්ධව | දැනට පවතින .යිබර් ග්ලාස් පුටු අළුත්වැඩියා කිරීම හා අළුතින් පුටු සවිකිරීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය මත (Your Home Furniture) ආයතනය වෙත ලබාදී ඇති බව සභාපතිතුමා විසින් කළමනාකාරීත්ව මණ්ඩලය වෙත දන්වා සිටින ලද අතර එම කටයුතු සිදුවෙමින් පවතින බවද වැඩිදුරටත් දන්වා සිටින ලදී.<br><br>පිහිණුම් තටාකය වෙන්කරවා ගත් ආයතනය වෙත දැනට පිහිණුම් තටාකයේ ෆයිබර් ග්ලාස් පුටු අළුත්වැඩියා කිරීම සඳහා ගලවා ඇති බැවින් සිදුවන අපහසුතාවය සම්බන්ධව ඔවුන්ව දැනුවත් කර ඇති බවත් පවසා සිටින ලදී. |
| 12. | 2014.07.31 | සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ පාපන්දු ක්‍රීඩා තරඟ සඳහා අයකරනු ලබන ගාස්තු සංශෝධනය කිරීම - පාපන්දු සම්මේලනය සඳහා | ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් දේශීය පාපන්දු තරඟාවලි සඳහා සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය වෙන් කරවා ගැනීම නිරතුරුවම සිදුකරයි. ක්‍රීඩාංගණය වෙන්කිරීම වෙනුවෙන් සහනඩ්යි පදනම මත අයකිරීමක් සිදුකරන ලෙස එම සංගමය විසින් ඉල්ලා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් දේශීය පාපන්දු තරඟාවලි සඳහා ක්‍රීඩාංගණ ගාස්තු සංශෝධනය කිරීමටත් අදාල සංශෝධිත ගාස්තු අයකිරීම 2014-08-01 දින සිට ක්‍රියාත්මක කිරීමට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. |
| 13. | 2014.08.26 | ශ්‍රී ලංකා තහනම් උත්තේජක ආයතනයට (SLADA) සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ ජුඩෝ ගොඩනැගිල්ල ආශ්‍රිතව ඉඩමේ කාර්යාලයක් සඳහා ගොඩනැගිල්ලක් ලබාදීම | ශ්‍රී ලංකා තහනම් උත්තේජක ආයතනය (SLADA) අළුතින් ස්ථාපිත කරන ලද ව්‍යාවස්ථාපිත ආයතනයක් වන අතර ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති එක් ආයතනයකි. එම ආයතනය සඳහා කාර්යාලීය පහසුකම් තාවකාලිකව ලබාගෙන ඇත්තේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙනි.<br><br>එබැවින් සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ ජුඩෝ ක්‍රීඩාගාරය පවත්වා ගෙන යන භූමියෙහි ශ්‍රී ලංකා තහනම් උත්තේජක ආයතනයට (SLADA) සිය කාර්යාල පහසුකම් පවත්වාගෙන යාමට අවශ්‍ය ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීමට ක්‍රීඩා අමාත්‍යාංශයෙන් උපදෙස් ලබාදී ඇති හෙයින් රාජ්‍ය තක්සේරුවට යටත්ව බදු මුදල් ලබා ගැනීමේ හා මාසික කුලී මුදල් අයකර ගැනීමේ පදනම මත භූමිය ලබාදීමට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. |
| 14. | 2014.09.30 | 2015 මුලධන ව්‍යාපෘති සඳහා උපදේශක සේවාව ලබාගැනීම | 2015 මුලධන ව්‍යාපෘති සඳහා රාජ්‍ය ආයතනයක් වන මධ්‍යම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙන් (CECB) සිවිල් ඉංජිනේරුමය උපදේශනය ලබාගැනීම සුදුසු බව තීරණය කරන ලදී.<br><br>රාජ්‍ය ආයතන සඳහා මෙම ආයතනයෙන් උපදේශක සේවාව ලබා ගැනීමට කැබිනට් අනුමැතියක්ද සහිත බව කළමනාකාරීත්ව මණ්ඩලය විසින් වැඩිදුරටත් දන්වා සිටින ලදී. එම කාර්යය මධ්‍යම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙන් (CECB) ඉටුකරවා ගැනීමට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය දෙන ලදී |

| අ.අ. | දිනය | කාරණය | විස්තරය |
|---|---|---|---|
| 15. | | ක්‍රීඩා උත්සව / තරඟ හා අනෙකුත් වෙන්කිරීම් පැවැත්වීමේදී වෙළඳ කුටි සඳහා මුදල් අයකිරීම | සුගතදාස ක්‍රීඩා සංකීර්ණයේ විවිධ ක්‍රීඩා හා උත්සව පැවැත්වෙන අවස්ථාවන්හිදී ක්‍රීඩාංගණ පහසුකම් ලබාගන්නා ආයතන විසින් අප අධිකාරියට ගෙවීමක් සිදුකර වෙළඳකුටි ලබාගැනීමට පෙළඹී සිටියි. එම වෙළඳකුටි වලින් ආහාර පාන නොවන වෙළඳ කුටි සඳහා දැනට පවතින ගාස්තු අයකිරීම එලෙසම සිදුකිරීමටත් ආහාර පාන සහ සිසිල් බීම අලෙවිකරන වෙළඳ කුටි සඳහා භූමිය ලබාදීම 2012 වසරේදී කළමනාකාරීත්ව මණ්ඩලය අනුමත ගාස්තු අයකිරීම (දැනට අයකරනු ලබන) හා අදාල ආයතනය සඳහා සහනයක් ලබාදීමේ පදනම මත ගාස්තු සංශෝධනය කිරීම කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී |
| 16. | | 2015 වර්ෂයේ යෝජිත මුලධන ව්‍යාපෘති | මුදල් අමාත්‍යාංශය ලේකම්, අචාර්ය පී බී ජයසුන්දර මහතා සමග ක්‍රීඩා අමාත්‍යාංශයේදී 2015 මුලධන ප්‍රතිපාදන ලබාදීම සම්බන්ධව පැවති සාකච්ඡාවේදී යෝජිත තරු තුනේ ක්‍රීඩා හෝටලය ඉදිකිරීම සඳහා රු මිලි 800 ක් හා සුගතදාස ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩාංගණයන්හි වැඩි දියුණුකිරීම් හා නව ව්‍යාපෘති සඳහා රු මිලි 500ක් වෙන් කිරීමට කටයුතු කරන බව පවසන ලද බව කළමනාකාරීත්ව මණ්ඩලය වෙත දන්වා සිටින ලදී.<br><br>ඒ අනුව දැනට පවත්වාගෙන යනු ලබන සුගතදාස හෝටලයේ සිදුකළ යුතු අලුත්වැඩියාවන් හා නවීකරණ කටයුතු සිදුකර පවත්වාගෙන යාමට සැළසුම් කර ඇති බවත්, යෝජිත තරු තුනේ හෝටලය එම භූමියේම ඉදිරිපසින් ඉදිකිරීමට යෝජිත සැළසුම් සකස් කරන බවත් සභාපතිතුමා විසින් කළමනාකාරීත්ව මණ්ඩලය වෙත දන්වා සිටින ලදී |
| 17. | | ආයතනය විසින් උපයා ගන්නා ලද ප්‍රතිපාදන වලින් කොටසක් ස්ථාවර තැන්පතුවක තැන්පත් කිරීම. | ආයතනය විසින් මේවනවිට උපයා ගනු ලැබූ ප්‍රතිපාදන වලින් එදිනෙදා නඩත්තු කටයුතු, ආයතනයට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම හා සේවක අතිකාල සඳහා ගෙවීම් සිදුකර ඉතිරි මුදල් සියල්ල ජංගම ගිණුමේ ඇති බවත්, එම මුදලින් කොටසක් ස්ථාවර ගිණුමක තැන්පත් කිරීම මඟින් ආයතනයට ආදායමක් ලැබෙන නිසා ආයතනයේ ගිණුම් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය බැංකුවේම එම ස්ථාවර තැන්පතු ආරම්භ කිරීම සුදුසු බව සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. |
| 18. | 2014.12.01 | සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාගාරය සඳහා ශබ්ද පරිපාලන යන්ත්‍ර හා ආලෝක පද්ධතිය වැඩි දියුණු කිරීම | සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ ප්‍රධාන ක්‍රීඩාගාරයේ සවිකර ඇති ශබ්ද පරිපාලන හා ආලෝක පද්ධතීන්ට අදාල උපාංග මීට වසර 23 කට පමණ පෙර සවිකරන ලද උපාංග හෙයින් වත්මන් සේවාදායකයින් විසින් මෙම පහසුකම් ඉල්ලා සිටිනු ලබන විට රැස්වීම් අංක 11/2014 (2014-12-01) අවශ්‍යතාවයන්ට අනුකූල නොවන බොහෝ අවස්ථා ඇත. එබැවින් 2015 වර්ෂයේ ප්‍රධාන ක්‍රීඩාගාරය අළුත්වැඩියා කිරීම සඳහා කටයුතු කිරීමට අදහස් කර ඇති බැවින් එම අවස්ථාවේදීම එම ශබ්ද පරිපාලන හා ආලෝක පද්ධතීන් ජාත්‍යන්තර මට්ටම දක්වා වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු පිළිබඳ සොයා බැලීම සුදුසු බව සභාපතිතුමා විසින් යෝජනා කර සිටින ලදී. එමෙන්ම, ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලබා සිටින යුඩී ඩීජේස් (UD DJS) ආයතනයෙන් මේ සඳහා අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම ලබාගැනීමට හැකියාවක් ඇති බවත් වැඩිදුරටත් සඳහන් කරන ලදී.<br><br>මේ සම්බන්ධව වාර්තාවක් ලබාදීම සඳහා කමිටුවක් පත්කිරීමට කළමනාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය ලබාදුනි. |
| 19. | | ආයතනික අවශ්‍යතාවය මත JM 1-1 කේතයේ තනතුරු බිහිකිරීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කිරීම. | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ සේවක ව්‍යුහය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කිරීමෙන් පසු අධිකාරියේ කළමනාකරු තනතුරු සඳහා වැටුප් කේතය MA – 3 විය. නමුත්, කළමනාකරුවන් විසින් ඉටුකරනු ලබන කාර්යය භාරය හා වගකීම් අනුව JM 1-1 වැටුප් කේතයට ඇතුළත් විය යුතු බව නිරීක්ෂණය වු බැවින්, එම වැටුප් කේතය සංශෝධනය කරන ලෙස අදාල නිළධාරීන්ගෙන් ඉල්ලීම් ඉදිරිපත්විය. මීට අමතරව සේවක ව්‍යුහය තුළ MA – 3 වැටුප් කේතය පැවතීම නිසා උසස්වීම් පටිපාටියට කුමානුකූලව නොමැති බවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් පෙන්වා දී තිබිණි. |

## 2014 වර්ෂය සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ විගණන කාර්යය

2014 විගණිත වර්ෂය සඳහා විගණන විමසුම් 12 ක ප්‍රමාණයක් ඉදිරිපත් වී ඇති අතර එයින් විමසුම් 10 ක් සඳහා පිළිතුරු සැකසීමට අධිකාරිය කටයුතු කර ඇත. විගණන කමිටුව එම වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03 ක් පැවැත්වීමට කටයුතු කර ඇත. ඒ අනුව,

01. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා 2014 වර්ෂයට අදාල පිළිතුරු ලබාදී ඇති අතර ඒවා ක්‍රියාවටද නංවා ඇත.

1999 අංක 17 දරණ සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරී පනතට අනුව එහි පළමු පරිච්ඡේදයේ අංක 03-02(ii) ට අනුව භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු පත්කළ යුතුව ඇත.

ඒ අනුව කළමනාකාරීත්ව මණ්ඩලය නියෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙකු එතෙක් පත්කර නොමැතිවූ බැවින් කළමනාකාරීත්ව මණ්ඩලයේ කටයුතුද කරගෙන යාමට අපහසුවී තිබුණි. එසේම අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව කාර්තුවකට එක් වරක් හෝ පැවැත්විය යුතුවේ.

අදාල පත්වීම සිදුකර නොමැති වූ බැවින් එතෙක් විගණන හා කළමනාකරන කමිටු රැස්වීම 2015 (01) පවත්වා ඇත්තේ 2015 මැයි මස 18 වෙනි දිනයේදීය.

02. ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 සඳහා (2014 වර්ෂයට අදාල) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ඊට අදාල නිළධාරීන් සහභාගි වී ඇත.

## භාණ්ඩ සමීක්ෂණය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2014 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය සඳහා 2014.12.12 දින අනු කමිටු 10 කින් සමන්විත භාණ්ඩ සමීක්ෂණ කමිටුව පත්කරන ලදි. රජයේ මුදල් රෙගුලාසි අනුව කටයුතු කෙරෙන මෙම භාණ්ඩ සමීක්ෂණයේ වාර්තාව සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) මඟින් අවසන් කොට ඇත.

## වාර්ෂික ප්‍රසම්පාදන

2014 මූල්‍ය වර්ෂය තුළ අධිකාරියේ ක්‍රියාකාරකම් උදෙසා සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය පහත පරිදි වේ.

| | ප්‍රසම්පාදනය | මුදල (රු) |
|---|---|---|
| 01 | සුගතදාස අධිකාරියේ ගෘහස්ථ, එළිමහන්, බෝගම්බර ක්‍රීඩාංගණයන් සඳහා ක්‍රීඩා භාණ්ඩ මිළදී ගැනීම | 4,031,702.00 |
| 02 | ලිපි ද්‍රව්‍ය මිළදී ගැනීම | 304,479.06 |
| 03 | ගෘහස්ථ සහ එළිමහන් ක්‍රීඩාංගණ සඳහා වතුර පෙරණයන් මිළදී ගැනීම | 517,000.00 |
| 04 | ගෘහස්ථ, බෝගම්බර ක්‍රීඩාංගණයන්හි කායවර්ධන මධ්‍යස්ථාන සඳහා කායවර්ධන උපකරණ මිළදී ගැනීම | 1,993,440.00 |
| 05 | ක්‍රීඩාංගණ සහායක හා ක්‍රීඩා නිළධාරීන් සඳහා නිළ ඇඳුම් සහ කායවර්ධන මධ්‍යස්ථාන සඳහා තුවා මිළදී ගැනීම | 314,564.24 |
| 06 | සුළු නඩත්තු, තීන්ත ආලේපන, නඩත්තු සහ වැසිකිළි පද්ධතිය වැඩිදියුණු කිරීමේ කාර්යය වෙනුවෙන් අමතර වැයවී ඇති මුදල සම්බන්ධ නිර්දේශ ලබා ගැනීම. | 496,061.20 |
| 07 | 2014 වසර සඳහා ආරක්ෂක නිළධාරීන්ට නිළ ඇඳුම් මසා ගැනීම සඳහා | 547,800.00 |
| 08 | එළිමහන් ක්‍රීඩාංගනයේ මීටර් 400 ධාවන පථය සම්බන්ධව තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම | 1,147,191.00 |
| 09 | 64-3180 රථයේ ඉන්ජිම අලුත්වැඩියා කිරීම | 360,000.00 |
| 10 | කාර්යාල උපකරණ මිළදී ගැනීම | 2,344,880.35 |
| 11 | ප්‍රධාන හා උප පිහිණුම් තටාකයන් සඳහා ජල පොම්ප මිළදී ගෙන සවි කිරීම | 9,011,619.60 |
| 12 | බෝගම්බර ක්‍රීඩාංගනය සඳහා විදුලි ජනක යන්ත්‍රයක් මිළදී ගැනීම | 1,344,000.00 |
| 13 | ආරක්ෂක කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීම | 13,726,187.88 |
| 14 | PVC අයිතම මිළදී ගැනීම | 559,558.00 |
| 15 | පිහිණුම් තටාක සඳහා උපකරණ මිළදී ගැනීම | 524,550.40 |
| 16 | එළිමහන් ක්‍රීඩාංගණයේ අතිවිශේෂ අමුත්තන්ගේ කාමර, ගෘහස්ථ ක්‍රීඩාංගණයේ පාලන කාමර, පිහිණුම් තටාක පරිශ්‍රය සඳහා තිරරෙදි මැසීම | 254,760.90 |
| 17 | බෝගම්බර ක්‍රීඩාංගනයට ත්‍රීරෝද රථයක් මිළදී ගැනීම | 495,270.00 |
| 18 | සුගතදාස අධිකාරියේ වාහන සඳහා රක්ෂනාවරණයක් ලබා ගැනීම | 352,694.54 |
| 19 | 10 වැනි ආසියාතික යොවුන් පිරිමි වොල්බෝල් ශුරතාවලිය වෙනුවෙන් වොලිබෝල් උපකරණ කට්ටලයක් මිළදී ගැනීම | 590,000.00 |
| 20 | ගිණුම් අංශය සඳහා ගිණුම්කරන මෘදුකාංග නිර්මාණය කර මිළදී ගැනීම | 720,000.00 |
| 21 | පරිගණක හා පරිගණක උපාංග මිළදී ගැනීම | 4,223,280.00 |
| 22 | එළිමහන් ක්‍රීඩාංගනයේ ඇති අධිබලැති විදුලි කුළුණු සඳහා බල්බ මිළදී ගැනීම | 2,475,000.00 |
| 23 | බෝගම්බර ක්‍රීඩාංගනයට පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනීම | 1,380,000.00 |
| 24 | විශේෂ අමුත්තන්ගේ පුටු මිළදී ගැනීම | 1,312,500.00 |

අනෙක් පිටුවට...

| | ප්‍රසම්පාදනය | මුදල (රු) |
|---|---|---|
| 25 | එළිමහන් ක්‍රීඩාංගනයේ අධිබලැති විදුලි කුළුණු සඳහා Igniter මිළදී ගැනීම | 1,325,000.00 |
| 26 | බෝගම්බර, ගෘහස්ථ, එළිමහන් ක්‍රීඩාංගන සඳහා ආරක්ෂක උපකරණ මිළදී ගැනීම | 296,514.00 |
| 27 | පිහිණුම් තටාකවලට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය මිළදී ගැනීම | 2,776,851.36 |
| 28 | 32 ශ්‍රී 5811 රථය අලුත්වැඩියා කිරීම | 575,482.20 |
| 29 | ආරක්ෂක කැමරා පද්ධතිය සවිකිරීම වෙනුවෙන් වැයවූ මුදල සම්බන්ධව නිර්දේශ ලබා ගැනීම | 684,361.18 |
| 30 | ගෘහස්ථ ක්‍රීඩාංගනයේ වායු සමීකරණ පද්ධතියේ නඩත්තු සේවාව ලබා ගැනීම | 315,000.00 |
| 31 | එළිමහන් හා ගෘහස්ථ ක්‍රීඩාංගන සඳහා රතු පලස් මිළදී ගැනීම | 507,812.50 |
| 32 | එළිමහන් හා බෝගම්බර ක්‍රීඩාගදන සඳහා ක්‍රීඩා භාණ්ඩ මිළදී ගැනීම | 688,200.00 |
| 33 | 2014 වර්ෂයේ මූලධන ව්‍යාපෘති යටතේ ඉටු කිරීමට නියමිත Two capacitor Banks (Main & Electrical) & Electrical Control panel for pool & arena යන | 945,000.00 |

# සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය

සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය පහත සඳහන් අංග වලින් සමන්විත වේ.

- ගෘහස්ථ ක්‍රීඩාගාරය
- උප ක්‍රීඩාගාර (බැඩ්මින්ටන්, ස්කොෂ් හා මේස පන්දු)
- පිහිණුම් තටාක සංකීර්ණය
- කායවර්ධන මධ්‍යස්ථානය
- ක්‍රීඩා හෝටලය




"යොනෙක්ස් - සන්රයිස්" ජාත්‍යන්තර අභියෝගතා බැඩ්මින්ටන් තරඟාවලිය - 2014

# ගෘහස්ථ ක්‍රීඩාගාරය



ගෘහස්ථ ක්‍රීඩාගාරය ආසන 5004 කින් සැදුම්ලත් වායු සමීකරණය කළ ප්‍රේක්ෂකාගාරයකින් සමන්විත වන අතර, මෙහි ගෘහස්ථ ක්‍රීඩා පිටියෙහි පළළ මීටර් 35 ක් හා දිග මීටර් 40 ක් වේ. මෙම ක්‍රීඩාගාරයේ පැසිපන්දු, බැඩ්මින්ටන්, දැල්පන්දු, ජූඩෝ, ජිම්නාස්ටික්, වොලිබෝල්, මේස පන්දු, බොක්සිං, කරාතේ, මල්ලවපොර ආදී ගෘහස්ථ ක්‍රීඩා තරඟ පැවැත්වීමට පහසුකම් සපයනු ලැබේ. මීට අමතරව විවිධ උත්සව, සම්මේලන, සංගීත සංදර්ශන, රාජ්‍ය උත්සව හා විවිධ වැඩමුළු සඳහා පහසුකම් සපයනු ලැබේ.

10 වැනි ආසියානු පිරිමි වොලිබෝල් තරඟාවලිය, යොනෙක්ස් සන්රයිස් ජාත්‍යන්තර බැඩ්මින්ටන් තරඟාවලිය, ලයන්ස් ජාත්‍යන්තර බෝක්සිං තරඟාවලිය, 48 වැනි ආසියානු කායවර්ධන ශූරතාවලිය, දෙරණ ඩ්‍රීම් ස්ටාර් ගෘහස්ථ ක්‍රීඩාගාරයේ මෙම වසරේදී පවත්වන ලද තරඟාවලි අතරින් කිහිපයකි.

2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාගාරයෙන් රු. 52,245,099.00 ක ආදායමක් උපදවා ඇත.

"ලයන්ස්" ජාත්‍යන්තර බොක්සිං තරඟාවලිය - 2014

**2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාංගණයේ පැවැති තරඟ /ශූරතාවලි සහ වෙනත් උත්සව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.**

| ක්‍රියාකාරකම | ජාත්‍යන්තර | ජාතික | එකතුව |
|---|---|---|---|
| ජිම්නාස්ටික් තරඟ | 01 | 01 | 02 |
| වොලිබෝල් තරඟ | 01 | - | 03 |
| බොක්සිං තරඟ | 01 | 05 | 06 |
| කරාතේ තරඟ | - | 05 | 05 |
| මේස පන්දු තරඟ | - | 01 | 01 |
| දැල්පන්දු තරඟ | - | 01 | 01 |
| සංගීත සංදර්ශණ (මෙගා) | 01 | 02 | 03 |
| සංගීත සංදර්ශණ (වෙළඳ නොවන) | - | 06 | 06 |
| පැසිපන්දු තරඟ | - | 08 | 08 |
| වුෂු තරඟ | - | 03 | 03 |
| බැඩ්මින්ටන් තරඟ | 01 | - | 01 |
| විභාග / අධ්‍යාපනික වැඩසටහන් | - | 36 | 36 |
| සම්මාන උළෙල | - | 11 | 11 |
| ළමා ක්‍රියාකාරකම් උත්සව | - | 02 | 02 |
| සම්මේලන | - | 13 | 13 |
| කායවර්ධන තරඟ | 01 | - | 01 |
| රැස්වීම් (පිහිණුම් තටාක දේශන ශාලාව) | - | - | 01 |
| පුහුණුවීම් | - | - | 43 |



48 වැනි ආසියානු කායවර්ධන ශූරතාවලිය 2014

දෙරණ ඩ්‍රීම් ස්ටාර් - 2014

# උප ක්‍රීඩාගාරය





මෙම උප ක්‍රීඩාගාර බැඩ්මින්ටන් ක්‍රීඩා පිටි දෙකකින් හා ස්කොෂ් ක්‍රීඩාගාර හතරකින් සමන්විත වන අතර ක්‍රීඩා තරඟ හා පුහුණුවීම් කටයුතු සඳහා පහසුකම් සපයයි.

# පිහිණුම් තටාක සංකීර්ණය

ජාතිය සතු ජාත්‍යන්තර මට්ටමේ සියලු පහසුකම් සහිත එකම පිහිණුම් තටාක සංකීර්ණය මෙම අධිකාරිය සතුව ඇති අතර, එය පහත දැක්වෙන අංග වලින් සමන්විත වේ.



ප්‍රධාන පිහිණුම් තටාකය



කිමිදුම් තටාකය



පුහුණුවීම් සඳහා උප පිහිණුම් තටාකය



ළමා පිහිණුම් තටාකය

මෙම පිහිණුම් සංකීර්ණය මඟින් පාසැල් පිහිණුම් තරඟ පැවැත්වීමේ සිට ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරඟ පැවැත්වීම දක්වා අවශ්‍ය පහසුකම් සපයනු ලබන අතර, දිවා/රාත්‍රී තරඟ සඳහා අධිබලැති විදුලි ආලෝක කුළුණු සහිත පහසුකම් සපයා ඇත. මීට අමතරව පාසැල් ළමුන් සඳහා පිහිණුම් පාසලක්ද පවත්වා ගෙන යන අතර මෙමගින් ඉතාමත් සහනදායී මුදලකට, පිහිණුම් තටාකාංගන පහසුකම් නොමැති ළමුන් සඳහා ඉතාමත් සහනදායී මුදලකට පහසුකම් සැපයීමෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි.

2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා පිහිණුම් තටාක වල පැවති තරඟ /ශූරතාවලි/පුහුණුවීම් හා පිහිණුම් සාමාජිකත්ව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| පාසල් ළමුන් සඳහා පිහිණුම් සාමාජිකත්ව | 480 |
| වැඩිහිටියන් සඳහා පිහිණුම් සාමාජිකත්ව | 188 |
| පිහිණුම් පාසැල් සාමාජිකත්ව | 100 |
| පිහිණුම් තරඟ | 25 |
| කිමිදුම් තරඟ | 04 |
| ජල පන්දු තරඟ | 08 |
| පුහුණුවීම් | 140 |

ඉහත තරඟ /ශූරතාවලි/පුහුණුවීම් හා පිහිණුම් සාමාජිකත්ව සැපයීමෙන් පිහිණුම් තටාකාංගන වලින් රු. 7,085,273.00 ආදායමක් උපදවා ඇත.



# ගෘහස්ථ ක්‍රීඩාංගණ කායවර්ධන මධ්‍යස්ථානය

මෙම ක්‍රීඩා සංකීර්ණය ස්ථාපනය කල යුගයේ සිට පවත්වාගෙන එනු ලබන කායවර්ධන මධ්‍යස්ථානයක් පවතින අතර එම මධ්‍යථානය පසුගිය වසරේදී නවීකරණය කොට ඒ සඳහා නවීන කායවර්ධන උපකරණද මිළදී ගනු ලැබිණ.

මෙම මධ්‍යථානය මගින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන්ම අනෙකුත් පාර්ශවයන්ටදසාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පහසුකම් ලබාගත හැක.

2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කායවර්ධන මධ්‍යස්ථානයෙන් රු. 1,640,907.00 ක ආදායමක් උපදවා ඇත.

# ක්‍රීඩා හෝටලය

**මෙම ක්‍රීඩා හෝටලය පහත අංගවලින් සමන්විත වේ.**

| | |
|---|---|
| **තනි කාමර** | **06** |
| **යුගල කාමර** | **14** |
| **වායුසමනය කළ යුගල කාමර** | **04** |
| **සමූහ කාමර** | **18** |



සුගතදාස ක්‍රීඩා සංකීර්ණය ස්ථාපනය කල යුගයේ සිට පවත්වාගෙන එනු ලබන මෙම ක්‍රීඩා හෝටලය කාමර 42 කින් සහ 100 දෙනෙකුට ආසන්න ප්‍රමාණයකට රැස්විය හැකි කාමර පහසුකම් වලින්ද, ක්‍රීඩකයන්ට නවාතැන් ගත හැකි සමුහ කාමර පහසුකම් වලින්ද සමන්විතවේ. මෙම හෝටලය මගින් කාමර පහසුකම් සැපයීමට අමතරව විවාහ මංගල උත්සව, රැස්වීම් හා වැඩමුළු සඳහා අවශ්‍ය පහසුකම්ද සපයනු ලබයි. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සුබසාධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් ඔවුන්ට සහ ජාතික ක්‍රීඩා සංගම් සඳහා සහනදායි පදනම මත මෙම හෝටලයේ පහසුකම් ලබා දෙනු ලැබේ.

ක්‍රීඩාංගණයේ අවශ්‍යතාවයන්ට බාධා නොවන පරිදි ඉඩ කඩ පවතින අවස්ථාවන් වලදී සාමාන්‍ය ජනතාව සඳහා පහසුකම් ලබා දීම සිදුකරයි. තවද මෙම වසරේදී ආහාරපාන සැපයීමක් නොකරන ලද හෙයින් මුළුතැන්ගෙය භාවිතා නොකරන ලදී. දැනට මෙහි නවාතැන් පහසුකම් පමණක් ලබාදෙයි. **2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ක්‍රීඩා හෝටලයෙන් රු 9,447,994.00 ක ආදායමක් උපදවා ඇත.**

තවද ක්‍රීඩා හෝටලය ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘතියක් ලෙස තරු තුනේ හෝටලයක් බවට පරිවර්ථනය කිරිමේ යෝජනාවක් ඉදිරිපත් වී තිබේ.

**2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාංගණයට අයත් ගෘහස්ථ ක්‍රීඩාගාරයෙන්, පිහිණුම් තටාකයෙන්, කායවර්ධන මධ්‍යස්ථානයෙන්, ක්‍රීඩා හෝටලයෙන්, බදු කුලී සහ වෙනත් ප්‍රභවයන්ගෙන් රු. 81,411,609.00 ක ආදායමක් උපදවා ඇත.**

**සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවළ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**
**(2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට)**

| | කාර්යය | ඇස්තමේන්තු වටිනාකම (රු. මිලියන) | 2013 වසර සඳහා (රු. මිලියන) | | 2014 වසර සඳහා (රු. මිලියන) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | |
| 01 | ඉලෙක්ට්‍රෝනික පාලක පුවරු අලුත්වැඩියා කිරීම - ගෘහස්ථ ක්‍රීඩා ගාරය, පිහිණුම් තටාකය | 0.50 | - | - | 0.50 | - | ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි. |
| 02 | ප්‍රධාන විදුලි පුවරුවේ ධාරිත්‍රක අලුතින් සවි කිරීම. | 0.50 | - | - | 0.50 | - | ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි. |
| 03 | ගෘහස්ථ ක්‍රීඩා ගාරයේ සහ පිහිණුම් තටාක ප්‍රේක්ෂකාගාරයේ ෆයිබර් පුටු සවි කිරීම සහ තීන්ත ආලේපනය කිරීම. | 13.16 | - | - | 13.16 | 12.814 | ව්‍යාපෘතිය අවසන් |
| 04 | විදුලි සහ ඉලෙක්ට්‍රෝනික පද්ධති වැඩිදියුණු කිරීම. (උණු වතුර පද්ධතිය සමඟ) | 3.00 | - | - | 3.00 | 2.827 | ව්‍යාපෘතිය අවසන් |
| 05 | සුළු අලුත්වැඩියා, තීන්ත ආලේපන, වැසිකිළි පද්ධතිය වැඩි දියුණු කිරීම. ගෘහස්ථ ක්‍රීඩාගාරය | 0.31 | - | - | 0.31 | 0.292 | ව්‍යාපෘතිය අවසන් |
| 06 | සුළු අලුත්වැඩියා, තීන්ත ආලේපන, වැසිකිළි පද්ධතිය වැඩි දියුණු කිරීම - ක්‍රීඩා හෝටලය | 3.18 | - | - | 3.18 | 2.291 | ව්‍යාපෘතිය අවසන් |
| 07 | පිහිණුම් සහ කිමිදුම් තටාකයන්හි ජල පෙරණ සේවා කිරීම. | 1.605 | - | - | 1.605 | 1.513 | ව්‍යාපෘතිය අවසන් |
| 08 | ප්‍රධාන සහ උප තටාකයන්හි ප්‍රධාන ජල පොම්ප වැඩිදියුණු කිරීම | 5.00 | - | - | 5.00 | 2.378 | ව්‍යාපෘතිය අවසන් වෙමින් පවතී. |
| 09 | කාර්යාලීය උපකරණ සහ ගෘහ භාණ්ඩ | 2.00 | - | - | 2.00 | 1.814 | ව්‍යාපෘතිය අවසන් |
| 10 | පරිගණක සහ උපාංග | 2.70 | - | - | 2.70 | 2.66 | ව්‍යාපෘතිය අවසන් |
| 11 | ක්‍රීඩා උපකරණ මිළදී ගැනීම | 11.57 | - | - | 11.57 | 4.89 | ප්‍රදානය කර ඇත |
| 12 | නව විදුලි ජෙනරේටරයක් මිළදී ගැනීම - 10 KV | 3.00 | - | - | 3.00 | 1.481 | ව්‍යාපෘතිය අවසන් |
| 13 | ආරක්ෂක කැමරා පද්ධතිය ස්ථාපනය කිරීම (ගෘහස්ථ, එළිමහන්, ක්‍රීඩා හෝටලය, වාහන නැවතුම්පල) | 14.50 | - | - | 14.50 | 14.50 | ව්‍යාපෘතිය අවසන් |
| 14 | ගිණුම්කරණ සහ තොග පාලන පරිගණක මෘදුකාංග ස්ථාපනය | 1.50 | - | - | 1.50 | - | ප්‍රදානය කර ඇත |
| 15 | ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ක්‍රීඩක විවේකාගාර සඳහා ලොකර මිළදී ගැනීම. | 0.10 | - | - | 0.10 | 0.10 | මිළදී ගැනීම් අවසන් |
| 16 | තිර රෙදි යෙදීම (එළිමහන්, ගෘහස්ථ, පිහිණුම් තටාක ප්‍රධාන අමුත්තන්ගේ ප්‍රේක්ෂකාගාර) | 0.38 | - | - | 0.38 | 0.38 | ව්‍යාපෘතිය අවසන් |
| 17 | වෙනත් | 1.50 | - | - | 1.50 | 1.466 | අවසන් |
| | **එකතුව** | **64.505** | - | - | **64.505** | **49.406** | |

# සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ 2015 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති

| | ව්‍යාපෘතිය | අයවැය ප්‍රතිපාදන 2014 (රු. මිලියන) |
|---|---|---|
| 01 | සමස්ථ ක්‍රීඩා හෝටලය ප්‍රතිසංස්කරණය කිරීම සහ නවීකරණය කිරීම. | 9.00 |
| 02 | ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ජිම්නාස්ටික් පොලව ප්‍රතිසංස්කරණය කිරීම. | 10.00 |
| 03 | ගෘහස්ථ/එළිමහන් ක්‍රීඩාංගණ සඳහා තිරරෙදි යෙදීම. | 2.00 |
| 04 | පරිගණක උපාංග සහ මෘදුකාංග (Firewall) | 3.00 |
| 05 | ඩිජිටල් දැන්වීම් පුවරු සවිකිරීම. (ගෘහස්ථ/එළිමහන්) | 10.00 |
| 06 | කාර්යාලීය උපකරණ මිළදී ගැනීම. | 2.00 |
| 07 | ගෘහස්ථ ක්‍රීඩාගාරය විශේෂ අමුත්තන්ගේ විවේකාගාරය සඳහා පුටු සහ ගෘහභාණ්ඩ මිළදී ගැනීම. | 2.00 |
| 08 | ක්‍රීඩා උපකරණ මිළදී ගැනීම. | 4.00 |
| | **එකතුව** | **42** |

# එළිමහන් ක්‍රීඩාංගනය



දිවා සහ රාත්‍රී කාල වලදී ජවන හා පිටිය ක්‍රීඩා තරඟ පැවැත්වීමට හැකි ආකාරයට මෙම ක්‍රීඩාංගණය සකසා ඇත. මෙම ක්‍රීඩාංගණයේ එකවර ප්‍රේක්ෂකයින් 20,000 කට පමණ තරඟ නැරඹිය හැකි ආකාරයට ක්‍රීඩාගාර පහසුකම් සපයා ඇත. ක්‍රීඩාංගණයේ මීටර් 400 හා මීටර් 200 වශයෙන් කෘත්‍රිම ධාවන පථ 02ක් ඇත. මීට අමතරව මහල් තුනකින් යුත් මාධ්‍ය කුටියක්, අධිබලැති විදුලි ආලෝක පද්ධතියක් මගින් රාත්‍රී ක්‍රීඩා තරඟ පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත. මෙම ක්‍රීඩා පිටියේ මලල ක්‍රීඩා, වොලිබෝල්, රගර්, පාපන්දු, පැසිපන්දු ක්‍රීඩා මෙන්ම විවිධ උත්සව සඳහාද පහසුකම් සපයනු ලැබේ.

**2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනයේ පැවැත්වූ තරඟ හා උත්සව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.**

| ක්‍රියාකාරකම | ජාත්‍යන්තර | ජාතික | එකතුව |
|---|---|---|---|
| පාපන්දු තරඟ | - | 42 | 42 |
| ක්‍රීඩා උත්සව (පාසල් නිවාසාන්තර තරඟ) | - | 18 | 18 |
| ක්‍රීඩා උත්සව (මීටර් 200 ධාවන පථය) | - | 52 | 52 |
| මලල ක්‍රීඩා තරඟ | - | 19 | 19 |
| රගර් තරඟ | - | 04 | 04 |
| වොලිබෝල් තරඟ | - | - | - |
| පුහුණුවීම් | - | - | 246 |
| ව්‍යායාම සඳහා ඇවිදීම් සාමාජිකත්ව | - | - | 116 |
| වෙළඳ රූගත කිරීම් | - | - | 01 |
| වෙනත් | - | - | 07 |



මීටර් 400 ධාවන පථය සහිත එළිමහන් ක්‍රීඩාංගණය

2014 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ පැවැත්වූ තරඟ, උත්සව, "ඩී" රථගාල, බදු කුලී හා වෙනත් ප්‍රභවයන් මඟින් රු. 37,825,307.00 ක ආදායමක් උපදවා ඇත.

## සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට)

| | කාර්යය | ඇස්තමේන්තු වටිනාකම (රු. මිලියන) | 2013 වසර සඳහා (රු. මිලියන) | | 2014 වසර සඳහා (රු. මිලියන) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | |
| 01 | පරිපාලන ගොඩනැගිල්ල සහ ක්‍රීඩා භාණ්ඩ අලෙවිසැල් ඉදි කිරීම - දෙවැනි අදියර | 18.00 | - | - | 18.00 | 16.103 | සම්පූර්ණ කර ඇත. |
| 02 | ඉලෙක්ට්‍රෝනික කාලගණක යන්ත්‍ර පද්ධතිය අලුත්වැඩියා කිරීම. | 2.50 | - | - | 2.50 | 1.971 | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 03 | ටෙනිස් සහ පැසිපන්දු පිටි වැඩි දියුණු කිරීම (පළමු අදියර) - රඳවා තබා ගැනීම් | 0.1 | - | - | 0.1 | - | ව්‍යාපෘතිය අවසන් |
| 04 | පරිපාලන ගොඩනැගිල්ල සහ ක්‍රීඩා භාණ්ඩ අලෙවිසැල් ඉදි කිරීම - උපදේශණ සේවා - පළමු අදියර | 0.93 | - | - | 0.93 | 0.93 | අවසන් |
| 05 | පරිපාලන ගොඩනැගිල්ල සහ ක්‍රීඩා භාණ්ඩ අලෙවිසැල් ඉදි කිරීම - පළමු අදියර | 18.19 | - | - | 18.19 | 12.917 | වැඩ අවසන් වෙමින් පවතී. |
| 06 | ගබඩා සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම - පළමු අදියර | 2.83 | - | - | 2.83 | 0.952 | වැඩ අවසන් වෙමින් පවතී. |
| 07 | ගබඩා සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම - දෙවැනි අදියර | 14.49 | - | - | 14.49 | 10.968 | ව්‍යාපෘතිය අවසන්. අතිරේක වැඩ සිදුකෙරේ. |
| | **එකතුව** | **57.04** | - | - | **57.04** | **43.841** | |

## සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ 2015 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති

| | ව්‍යාපෘතිය | අයවැය ප්‍රතිපාදන 2015 (රු. මිලියන) |
|---|---|---|
| 01 | මීටර් 400, මීටර් 200, මීටර් 80 ධාවන පථ නැවත ඇතිරීම සහ පාපන්දු ක්‍රීඩාංගණය වැඩිදියුණු කිරීම. | 80.00 |
| 02 | පරිපාලන ගොඩනැගිල්ල සහ ක්‍රීඩා භාණ්ඩ අලෙවිසැල් ඉදි කිරීම - තෙවැනි අදියර | 20.00 |
| 03 | සමස්ථ එළිමහන් ක්‍රීඩාංගණ සංකීර්ණයේ ප්‍රතිසංස්කරණ, සුළු අලුත්වැඩියාවන් සහ තීන්ත ආලේපනය කිරීම. | 10.00 |
| 04 | නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම. | 20.00 |
| 05 | පැසිපන්දු පිටි සංකීර්ණය (කුඩා ගෘහස්ථ ක්‍රීඩාංගණය) ඉදි කිරීම - පළමු අදියර | 48.00 |
| 06 | ඩිජිටල් ලකුණු පුවරු 02 අලුතින් සවි කිරීම. | 10.00 |
| | **එකතුව** | **188** |

# ආර්. ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගණය



ආර්. ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගණය අප රට සතු ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිකට් තරග පැවැත්වීමට ඇවැසි සියළු පහසුකම් වලින් සමන්විත එක් ක්‍රීඩාංගණයකි. මෙහි එකවර ප්‍රේක්ෂෙකකයින් 35,000 කට පමණ තරග නැරඹීමේ පහසුකම් ඇති අතර, විශාල රථ ගාලකින්ද යුක්ත වේ.  මෙම ක්‍රීඩාංගණය 2006-05-10 දින ගනු ලැබූ කැබිනට් මණ්ඩල තීරණයක් අනුව 2006-11-01 දින සිට වසර තිහක(30) කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මසකට රු. 250,000/- ක මුදලකට බදු දී ඇත. ඒ අනුව 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගණය මගින් රු. 3,000,000.00 ක ආදායමක් උපදවා ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධානතම ආදායම් මාර්ගයක්ව පැවති මෙම ක්‍රීඩාංගණය දීර්ඝ කාලීනව මාසික නොවෙනස් බදුකුළියක් සහිතව බදුදීම මෙම අධිකාරියේ ආදායම පහත වැටීමට බලපා ඇත.

# බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය



මෙම ක්‍රීඩාංගණය මහනුවර නගර සභාව විසින් පාලනය කරන ලද අතර 1999 සිට අප අධිකාරිය මගින් පාලනය කරනු ලැබේ. මෙම එළිමහන් ක්‍රීඩාංගණය තුල එකවර ප්‍රේක්ෂකයින් 10,000 කට පමණ තරඟ නැරඹිය හැකි ආකාරයේ ක්‍රීඩාගාර පහසුකම් ඇත. මෙහි මලල ක්‍රීඩා, පාපන්දු, රගර්, වොලිබෝල් , දැල්පන්දු, පාසැල් ක්‍රීඩා උත්සව හා වෙනත් උත්සව සඳහා පහසුකම් ඇත.

මෙම ක්‍රීඩාංගණය සඳහා නව කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකර ඒ සඳහා නවීන කායවර්ධන උපකරණද මිළදී ගනු ලැබූ අතර, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන්ම වෙනත් පාර්ශවයන්ටද හටද මෙහි සාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පහසුකම් ලබාගත හැක. මෙම නව කායවර්ධන මධ්‍යස්ථානයෙන් 2014 දෙසැම්බර් 31 දක්වා රු. 4,536,940.00 ක ආදායමක් උපයා ඇත.

ප්‍රසිද්ධ සංගීත සංදර්ශන ආදියට එළිමහන් රඨ ගාළ භාවිතා කිරීම සඳහා ඉඩ කඩ ලබා දුනහොත් ආදායම ඉහළ නැංවිය හැකි වුවත් ක්‍රීඩාංගණයේ තිබෙන ක්‍රීඩා පහසුකම් වලට හානි සිදුවිය හැකි බැවින් එසේ සිදුකරනු නොලැබේ.

**2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනයේ පැවැත්වූ තරඟ හා උත්සව, රඨ ගාලෙන් , කායවර්ධන මධ්‍යස්ථානය මගින් හා වෙනත් ප්‍රභවයන්ගෙන් රු. 8,477,420.00 ක ආදායමක් උපදවා ඇත.**



# බෝගම්බර කායවර්ධන මධ්‍යස්ථානය



2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගණයේ පැවැත්වූ තරඟ/ශූරතාවලි හා උත්සව පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| මලල ක්‍රීඩා තරඟ | - | 16 |
| පාසල් ක්‍රීඩා උත්සව | - | 47 |
| පාපන්දු තරඟ | - | 19 |
| රගර් තරඟ | - | 23 |
| පුහුණුවීම් | - | 686 |

## බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතින්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට)

| | කාර්යය | ඇස්තමේන්තු වටිනාකම (රු. මිලියන) | 2012 වසර සඳහා (රු. මිලියන) | | 2013 වසර සඳහා (රු. මිලියන) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | |
| 01 | නව පරිපාලන ගොඩනැගිල්ලක් සහ ක්‍රීඩා භාණ්ඩ වෙළඳ සැල් ඉදිකිරීම - අදියර 1 සහ 2 (රඳවා තබා ගැනීම් සහ සම්මත තාක්ෂණික කම්ටු ගෙවීම්) | 10.85 | - | - | 10.85 | 9.215 | පළමු අදියර අවසන්, දෙවැනි අදියර ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 02 | ශක්ති වර්ධන ශාලාව ඉදිකිරීම - අදියර 1, 2 සහ 3 (රඳවා තබා ගැනීම් සහ සම්මත තාක්ෂණික කම්ටු ගෙවීම්) | 3.60 | - | - | 3.60 | 1.788 | අවසන් |
| 03 | දුණුමඩලාව ඇල ඉදිකිරීම - අදියර 1 | 7.42 | - | - | 7.42 | 4.461 | අවසන් |
| 04 | විදුලි පද්ධතිය නැවත ස්ථාපනය කිරීම (රඳවා තබා ගැනීම්) | 0.58 | - | - | 0.58 | 0.58 | අවසන් |
| 05. | දුණුමඩලාව ඇල ඉදිකිරීම - අදියර 2 | 5.00 | - | - | 5.00 | 4.269 | ව්‍යාපෘතිය අවසන් |
| 06. | සුළු අලුත්වැඩියාවන්, තීන්ත ආලේපනය, නවීකරණ කටයුතු | 6.00 | - | - | 6.00 | 3.634 | ව්‍යාපෘතිය අවසන් |
| 07. | පරිපාලන ගොඩනැගිල්ල සහ ක්‍රීඩා භාණ්ඩ වෙළඳ සැල් ඉදිකිරීම - අදියර 3 | 20.00 | - | - | 20.00 | 10.57 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. |
| | **එකතුව** | **53.45** | - | - | **53.45** | **34.517** | |

## බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනයේ 2015 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති

| | ව්‍යාපෘතිය | අයවැය ප්‍රතිපාදන 2014 (රු මිලියන) |
|---|---|---|
| 01 | දුණුමඩලාව ඇල සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 3 | 40.00 |
| 02 | ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා විවේකාගාර සහ නාන කාමර ඉදිකිරීම. | 3.00 |
| 03 | සියළුම ප්‍රේක්ෂකාගාර සහ නාන කාමර ප්‍රතිසංස්කරණය කිරීම. | 2.00 |
| | **එකතුව** | **45.00** |

# බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක



බෙලිඅත්ත කිමිදුම් තටාකය



බෙලිඅත්ත ප්‍රධාන පිහිණුම් තටාකය



වීරකැටිය පිහිණුම් තටාකය

**මෙම පිහිණුම් තටාක පහත අංග වලින් සමන්විතය.**

### බෙලිඅත්ත

(1) මංතීරු 08 ක් සහිත මීටර් 50 ක් දිගැති පිහිණුම් තටාකය

(11) කිමිදුම් තටාකය

### වීරකැටිය

(1) මංතීරු 08 ක් සහිත මීටර් 25 ක් දිගැති පිහිණුම් තටාකය

බෙලිඅත්ත කාර්මික විදුහලේ හා වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විදුහලේ පිහිණුම් තටාකවල පරිපාලනය හා නඩත්තු කටයුතු පමණක් 2008-08-07 දින සිට සුගතදාස අධිකාරිය විසින් සිදූ කරනු ලැබුවත් මෙම පිහිණුම් තටාක වල අයිතිය සුගතදාස අධිකාරිය සතු නොවේ. අවට ප්‍රදේශ වල වැඩිහිටියන් හා පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට පිහිණුම් පුහුණු කටයුතු සඳහා පහසුකම් සැපයීම සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය මගින් සිදුකරනු ලබයි.

**2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම පිහිණුම් තටාකාංගන වල පැවති තරඟ/පුහුණුවීම් හා පිහිණුම් සාමාජිකත්ව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.**

| | |
|---|---|
| පාසල් ළමුන් සඳහා පිහිණුම් සාමාජිකත්ව | -23 |
| වැඩිහිටියන් සඳහා පිහිණුම් සාමාජිකත්ව | -12 |
| පිහිණුම් තරඟ | -04 |
| පුහුණුවීම් | -98 |

මෙම පිහිණුම් තටාක වල 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මුළු ආදායම රු. 470,103.00 ක් වේ.මෙම පිහිණුම් තටාක දෙක පිළිබඳව වැඩිහිටියන්, පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ක්‍රීඩා සමාජ දැනුවත්කළද සහභාගිත්වය ඉතා අඩු බැවින් ඉහළ ආදායමක් අපේක්ෂා කළ නොහැක.

තවද වීරකැටිය පිහිණුම් තටාකය පිහිටා ඇත්තේ වීරකැටිය මධ්‍ය විද්‍යාල භූමිය තුළය. ඒ අනුව පිහිණුම් තටාකයට ප්‍රවේශයද විදුහලේ ප්‍රධාන දොරටුවෙන් සිදුවන බැවින් පිහිණුම් තටාකය ඌණ උපයෝජනයකට පත්ව ඇත.මෙම පිහිණුම් තටාක වල නඩත්තු කටයුතු සඳහා දරණ වියදමට සාපේක්ෂව ආදායමක් නොලබන බවද සඳහන් කළ යුතුය.

# නුවරඑළිය

# තුරඟ තරඟ පිටිය




**2011/09/07 දින ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නුවරඑළිය තුරඟ තරඟ පිටියේ කළමණාකාරීත්වය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට පවරන ලදී.**

බිම් ප්‍රමාණය හෙක්ටයාර 34,564 ක් වූ මෙම තුරඟ තරඟ පිටියෙන් 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අශ්වගාල් වලින්, බදු කුලී, අශ්ව / පෝනී ඇවිදීම වෙනුවෙන් 10% කුලී, උත්සව සමය සඳහා භූමිය කුලී පදනම මත ලබාදීම හා රථවාහන නවතා තැබීමේ කුලී, යන ප්‍රභව මගින් **රු. 3,910,097.00** ක ආදායමක් උපයා ගනු ලැබීය.

# ආයතනයේ සමස්ථ ප්‍රගතිය

2014 වර්ෂයේ අධිකාරියේ මුලධන වියදම රු. 137,218,604.00 ක් වු අතර, ක්‍ෂය හා පාරිතෝෂික වෙන් කිරීම සමඟ මෙහෙයුම් වියදම රු. 304,448,557.00 කි. මින් රු. 88,122,824.00 ක මුදලක් ස්ථාවර වත්කම් සඳහා ක්‍ෂය වෙන්කිරීම් වේ.

2014 වර්ෂය සඳහා අධිකාරිය මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස රු. 175,000,000.00 ක් හා වර්තන ප්‍රතිපාදන ලෙස රු. 100,980,000.00 ක මුදලක් ලබාගෙන ඇත. පසුගිය වර්ෂයට සාපේක්‍ෂව ලබාගත් වර්තන ප්‍රතිපාදන මුදල රු. 4,180,000.00 කින් අඩුවී ඇත.


2014 වර්ෂයේ අධිකාරිය විසින් උපයා ඇති ආදායම රු. 134,613,748.00 ක් වන අතර එය 2013 වර්ෂයට වඩා රු. 45,582,588.00 ක වැඩිවීමකි.

2014 වර්ෂයේ වියදම 2013 වර්ෂයට වඩා වැඩිවීමට වැටුප් හා දීමනා රු. 18,390,000.00 ක්, ක්ෂය වෙන්කිරීම් රු. 7,990,427.00 ක්, අනෙකුත් වියදම් රු. 24,332,036.00 ලෙස වැඩිවීම ප්‍රධාන ලෙස බලපා ඇත.

2014 වර්ෂයේ ආයතනය විසින් උපයා ඇති ආදායම රු. 134,613,748.00 ක් වු අතර ක්‍ෂය වෙන්කිරීම සමග මුළු වියදම රු. 304,448,557.00 ක් විය.

## 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ආයතනය විසින් උපයා ඇති ආදායම් පහත පරිදි විචලනය වී ඇත.

| වර්ෂය | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් රු. මිලි. | 60.65 | 54.78 | 57.85 | 61.60 | 69.00 | 77.17 | 89.03 | 134.61 |




2012, 2013, 2014, වර්ෂ අනුපිළිවෙලින් සැලකීමේදී 11.84%, 15.37%, 51.2% ලෙස පිළිවෙලින් ආදායමේ ක්‍රමික ඉහළ යාමක් දක්නට ඇත.

2014 වර්ෂය සැළකීමේදී අධිකාරියේ ආදායම 51.2% ලෙස ඉහළ අගයකින් වැඩිවීම සුවිශේෂී තත්ත්වයකි.

## ආයතනයේ මුළු ණය

2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා තිබූ ණය තත්ත්වය පහත ආකාරයට විචලනය වී ඇත.

| වර්ෂය | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් රු. මිලි. | 1.50 | 2.30 | 4.61 | 133.03 | 42.95 | 42.04 | 41.00 | 45.00 |

2011, 2012, 2013 වර්ෂ සැලකීමේදී පැවැති ණය තත්ත්වය සීඝ්‍ර අඩුවීමක් දක්නට ලැබුණත් 2014 වර්ෂයේදී එහි ඉහළ යාමක් දක්නට ලැබේ.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

# ගිණුම්කරණ ප්‍රතිපත්ති 2014

# 01. සාමාන්‍ය

### 1.1 අනුකූල වීමේ ප්‍රකාශය

සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ගිණුම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

### 1.2 පිළියෙල කිරීමේ පදනම

මුල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර ඉඩම් ගොඩනැගිලි සහ යන්ත්‍ර සූත්‍ර ප්‍රත්‍යාගණනය සඳහාවූ ගැලපිලිකිරීම් ගිණුම් වල දක්වා ඇත. මෙහිදී උද්ධමන තත්වයන් සැලකිල්ලට ගෙන නොමැත

### 1.3 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලුම ප්‍රමාණාත්මක බලපෑම් තිබේනම් ඒ සඳහා මුල්‍ය වාර්ථාවල අවශ්‍ය ගැලපීම් සිදුකර ඇති අතර එම ගැලපීම් ගිණුම් වල හෙලිදරව් කර ඇත.

# 02. වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

ශේෂපත්‍රයෙහි පෙන්නුම් කරන වත්කම් වලින් ජංගම වත්කම් ලෙස හඳුනා ගෙන ඇත්තේ මුදල් සහ බැංකු ශේෂයන් සහ සාමාන්‍ය ගණුදෙනු ක්‍රියාවලිය තුලදී වසරක් තුල මුදල් බවට පරිවර්ථනය විය හැකි යැයි සැලකෙන අයිතම වේ.

### 2.1 වත්කම්

දේපල, පිරියත හා යන්ත්‍ර උපකරණ යන වත්කම් වල අගය පෙන්වා ඇත්තේ සමුච්චිත ක්ෂය අඩුකල පසු අගයටය.

ගොඩනැගිලි වත්කම් වල අඩංගු වන පිරිවැය වන්නේ ද්‍රව්‍ය හා ඍජු ශ්‍රම පිරිවැයයි. එසේම ස්ථාවර වත්කම් ප්‍රධාන උප අංශවලට වෙන්කර ඇත්තේ ඒවායේ ප්‍රයෝජනයට ගනු ලැබූ කාලය සලකා බලාය.

**ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය**

ආර් ප්‍රේමදස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය 2006-11-01 දින සිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයයෙන් මසකට රු. 250,000/- අයකිරීම් පදනම මත වසර 30ක කාලයකට බදු පදනම යටතේ ලබාදී ඇත. 2006-12-31 වන දින වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මඟින් ඉදිකරන ලද ගොඩනැගිල්ල සඳහා සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට රු 25,753,844.64 මුදලක් අයවිය යුතුව තිබෙන අතර ඒ පිළිබඳව හා වර්තමානයේ අයකරගනු ලබන මාසික කුලිය පිළිබඳව දෙපාර්ශවය අතර එකඟතාවයට පැමිණීමට බලාපොරොත්තු වේ.

**<u>බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක සංකීර්ණය</u>**

බෙලිඅත්ත කාර්මික විදුහලේ හා වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විදුහලට අයත්ව තිබූ පිහිණුම් තටාක දෙක සහ කිමිදුම් තටාකය 2008 වසරේ අගෝස්තු 07 දින සිට සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් නඩත්තු කටයුතු සිදුකරනු ලබයි. අධිකාරියේ කළමනාකරණ අනුමැතිය මත සේවකයින් දස (10) දෙනෙක් තාවකාලික පදනම මත අනුයුක්ත කර ඇත.

2008 වසරේ මෙම පිහිණුම් තටාක වල වියදම් ගෘහස්ථ ක්‍රීඩාංගණයේ වියදම් ලෙස ගිණුම් ගත කලද කළමනාකරණ මණ්ඩල තිරණ මත 2009 වසරේ සිට මෙම පිහිණුම් තටාක වල වියදම් වෙනම ගිණුම් වල දැක්වේ.

### 2.2 අනෙකුත් වියදම්

දේපල පිරියත හා උපකරණ තුල අඩංගු කොටස් නැවත ස්ථාපිත කිරීම සඳහා දරණ ලද වියදම් වෙනම ගිණුම්ගත කර ඇති අතර එවා ප්‍රාග්ධනික කර ප්‍රයෝජනවත් ආයුකාලය තුල ලියාහැරීම සඳහා ගිණුම් ගත කර ඇත. අනෙකුත් වියදම් ප්‍රාග්ධනිත කර ඇත්තේ එම වියදම් මඟින් වත්කම් වල අනාගත ආර්ථික ප්‍රතිලාභ වල වර්ධනයක් සිදුවන වියදම් වන අතර අනෙකුත් සියළුම වියදම් ආදයම් ප්‍රකාශනයට ගලපා ඇත.

### 2.3 ක්‍ෂයවීම්

ක්‍ෂය ප්‍රතිපත්තිය ලෙස සරල මාර්ගක්‍රමය අනුගමනය කරනු ලබන අතර වත්කම් වල ක්‍ෂය වීම් සිදුකරන්නේ වත්කම් මිලදී ගත් වර්ෂයේ හෝ ඉදිකිරීම් සම්පූර්ණ කල වසරේ සිටය. ක්‍ෂය අපේක්‍ෂිත ආයුකාලය තුල ආදයම් වියදම් ගිණුමට ලියා හැර ඇත. ඉඩම් සඳහා ක්‍ෂයවීම් සිදු කර නොමැත.

- ගොඩනැගිලි සහ ඉදිකිරීම් 2.5%
- අධිබලැති විදුලි කුලුණු 10%
- කෘතිම ධාවන පථය 20%
- යන්ත්‍ර හා උපකරණ 10%
- පරිගණක 25%
- මෝටර් රථ 20%
- ක්‍රීඩා උපකරණ 10%
- ලී බඩු හා උපකරණ 10%
- කාර්යාලීය උපකරණ 10%
- තිරරෙදි 50%
- අධිබලැති විදුලි බල්බ සහ ජ්වලකය(ඉග්නයිටර්) 50%

32-5811 දරණ පැජරෝ රථය මිනස්බල හා යෙදවුම් අමාත්‍යංශය යටතේ ලියාපදිංචි කර ඇති හෙයින් අප අධිකාරියේ වත්කමක් ලෙස සැලකිය නොහැක. ඊට අදල නඩත්තු හා අනෙකුත් වියදම් අධිකාරියේ ආදයම් වියදම් ප්‍රකාශයේ දක්වා ඇත.

64-3180 දරණ පැජරෝ රථය ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යංශය යටතේ ලියාපදිංචි කර ඇති හෙයින් අප අධිකාරියේ වත්කමක් ලෙස සැලකිය නොහැක. ඊට අදල නඩත්තු හා අනෙකුත් වියදම් අධිකාරියේ ආදයම් වියදම් ප්‍රකාශයේ දක්වා ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150 ට අනුව මහා භාණ්ඩාගාරයෙන් රු. 9,100,000 ක් වටිනා NB-1527 අංක දරණ නව වෑන් රථය ලබාදී ඇත. එම වාහනයේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම්ගත කර ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150 ට අනුව මහා භාණ්ඩාගාරයෙන් රු. 7,500,000 ක් වටිනා PD-9713 අංක දරණ නව කැබ් රථය ලබාදී ඇත. එම වාහනයේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම්ගත කර ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150 ට අනුව මහා භාණ්ඩාගාරයෙන් රු. 210,267.86 ක් වටිනා BBG-3006 අංක දරණ නව යතුරු පැදිය ලබාදී ඇත. එම යතුරු පැදියේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම්ගත කර ඇත.

### 2.4 වෙළඳ හා අනෙකුත් ණය ගැනීම්

වෙළඳ හා අනෙකුත් ණය ගැනීම් මුල්‍ය ප්‍රකාශ වල දක්වා ඇත්තේ ඒවායේ ශුද්ධ උපලබ්දිත අගය මතය.

### 2.5 තොග

තොග මුල්‍ය වාර්ථාවල දක්වා ඇත්තේ පිරිවැයටය. තොග වටිනාකම් වල ප්‍රථම ලැබුම්, ප්‍රථම නිකුතු ක්‍රමය මත තීරණය කරන අතර එයට මිලදී ගැනුම් පිරිවැය හා තොග වර්ථමාන තත්වය හා අදල ස්ථානයට ගෙනෙන තෙක් දරණ සියලුම වියදම් වලට අදල වේ.

## 03 වෙන් කිරීම් හා වගකීම්

මුල්‍ය වාර්ථා පිළියෙල කිරීමේ දී හදුනාගන්නා ලද සියළුම වගකීම් ගිණුම්ගත කර ඇත. මුල්‍ය වර්ථා වල ජංගම වගකීම් ලෙස හදුනාගෙන ඇත්තේ ශේෂපත්‍ර දින සිට වසරක් තුල ගෙවා නිමකල යුතු හෝ ඉල්ලු විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වසරකට වඩා වැඩි කාලයක් තුලදී ගෙවා නිමකල යුතු වගකීම් ය.

### 3.1 සේවක හිමිකම්

සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලට කරන ලද දයකත්වයන් මුල්‍ය වාර්තාවල වියදම් ලෙස හදුනාගෙන ඇත.

### 3..2 වෙළඳ හා අනෙකුත් ගෙවීම්

වෙළඳ හා අනෙකුත් ගෙවීම ඒවායෙහි පිරිවැය මත මූල්‍ය වාර්තා වල දක්වා ඇත.

### 3.3 සේවක විශ්‍රාම පාරිතෝෂික

පාරිතෝෂික සඳහා මූල්‍ය වාර්ථා වල වෙන්කිරීම් සිදුකර ඇති අතර ප්‍රථම සේවා වර්ෂයේ සිටම සෑම සේවකයෙක්ම මෙම වෙන්කිරීම් සඳහා සලකා ඇත. මෙය ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිති අංක 16 ට අනුකූල වන ලෙස සිදුකර ඇත. කෙසේ වෙතත් මෙම ගෙවීම් සිදුකරනු ලබන්නේ 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත අනුව හිමිකම් ලබා අඛණ්ඩ වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කල සේවකයන්ට පමනි.

## 04 ආදායම් ප්‍රකාශය

### 4.1 ආදායම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 29 අනුව අදල සේවාවන් සැපයීමෙන් පසු උපචිත පදනම මත අදයම් හදුනාගෙන ඇත.

### 4.2 වියදම්

ආදයම් විස්තරයේ ලාභය හෝ අලාභය හදුනාගෙන ඇත්තේ බදුවලට පෙර හා සියලුම හදුනාගත් වගකීම් සඳහා වෙන්කිරීම් කිරීමෙන් පසුය.

ශුද්ධ හිඟය ගණනය කිරීමේදී වත්කම් නඩත්තු කිරීමේ සහ ව්‍යපාරය පවත්වාගෙන යෑම සඳහා දරණ ලද වියදම් අදයම් විස්තරයට ගලපා ඇත.

ආයතනයේ පහසුකම් ලබාදීඇති නිළධාරීන් සහ සේවකයන්ගෙන් දුරකථන, විදුලි, ජල බිල්පත් සහ කුලී අයකරගනු ලබන අතර අදල වියදම් තීරු තුල පෙන්වා ඇත.

### 4.3 මූල්‍ය වියදම්

ස්ථාවර තැන්පතු වල පොලී ආදයම උපචිත ක්‍රමයට ගිණුම් ගත කර ඇත. පොලී වියදම් සහ අනෙකුත් ණය වියදම්, මූල්‍යය වියදම් ගණනය කිරීමේදී ගලපා ඇත.

### 4.4 දීමනා

ප්‍රදාන හා ආධාර ඊට අදල වියදම් වලට සරිලන පරිදි ගලපා ඇත. වත්කම් වලට අදල මූල්‍යමය නොවන ප්‍රදාන එහි මූල්‍ය වටිනාකමට ගිණුම් ගත කර ඇති අතර එම වත්කම් ප්‍රයෝජනවත් ආයුකාලය තුලදී ආදයම් ප්‍රකාශයට ලියාහරිනු ලැබේ.

## 05. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

### 5.1 මුදල්

මුදල් යනුවෙන් හදුන්වා ඇත්තේ අත ඉතිරි මුදල් සහ ඉතා ඉහල ද්‍රව ශීලතාවයක් සහිතව මුදල් බවට පරිවර්ථනය කළහැකි එසේ පරිවර්ථනය කිරීමේදි කිසිදු අවධානමක් රහිත වත්කම් වේ. මේ සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් යනු, ඇතැති මුදල් හා බැංකු මුදල් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත්තේ වක්‍ර ක්‍රමය පදනම් කරගෙනය.

## 06. ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසු වූ ප්‍රමාණාත්මක සිදුවීම් සියල්ල සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය ගැලපීම් ගිණුම් මගින් හෙලිදරව් කර ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

1. ආදායම් වියදම් ප්‍රකාශය

2. ශේෂ පත්‍රය

3. අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

# ආදායම් වියදම් ප්‍රකාශය

## 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය

| | 2014.12.31 (රුපියල්) | 2013.12.31 (රුපියල්) |
|---|---|---|
| ආදායම | 134,613,748 | 89,031,160 |
| | **134,613,748** | **89,031,160** |
| | | |
| රජයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන | 100,980,000 | 96,800,000 |
| | | |
| | **100,980,000** | **96,800,000** |
| | | |
| මුළු ආදායම | **235,593,748** | **185,831,160** |
| | | |
| **වියදම්** | | |
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක වේතන වියදම් | (124,843,606) | (106,453,606) |
| කළමණාකාරීත්ව මණ්ඩලයේ දීමනා හා වියදම් | (489,500) | (488,500) |
| පාරිතෝෂිත වෙන්කිරීම් | (3,548,586) | (7,847,352) |
| ක්ෂයවීම් | (88,122,824) | (80,132,397) |
| අනෙකුත් වියදම් | (87,444,041) | (63,112,005) |
| | **(304,448,557)** | **(258,033,860)** |
| | | |
| මෙහෙයුම් අතිරික්තය (හිඟය) | **(68,854,810)** | **(72,202,700)** |
| අතිරික්ත පාරිතෝෂිත වෙන්කිරීම් | - | - |
| මූල්‍ය වියදම් | (3,598,301) | (10,248,227) |
| බදු පෙර අතිරික්තය (හිඟය) | **(72,453,110)** | **(82,450,927)** |
| | | |
| එකතුකළ : මෙහෙයුම් නොවන ආදායම් | - | - |
| ස්ථාවර තැන්පතු පොලී ආදායම | 1,268,724 | 2,226,688 |
| පෙර බදු ශුද්ධ අතිරික්තය (හිඟය) | **(71,184,387)** | **(80,224,239)** |
| | | |
| **ආදායම් බදු** | (123,701) | (235,887) |
| **වර්ෂයේ අතිරික්තය (හිඟය)** | **(71,308,087)** | **(80,460,127)** |

# ශේෂ පත්‍රය - 2014 දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රය

| වත්කම් | 2014.12.31 (රුපියල්) | 2013.12.31 (රුපියල්) |
|---|---|---|
| **ජංගම වත්කම්** | | |
| මුදල් හා බැංකු ශේෂය | 85,916,015 | 17,498,861 |
| ණය ගැතියෝ | 44,646,521 | 40,999,600 |
| තොගය | 8,969,437 | 9,926,389 |
| කාර්‍ය මණ්ඩලයේ දස මාසික ණය ලබාදීම් | 19,556,204 | 16,105,588 |
| අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු ශේෂ | 63,647,064 | 53,072,037 |
| | **222,735,240** | **137,602,475** |
| **ස්ථාවර වත්කම්** | | |
| ඉඩම් | 2,856,612,140 | 2,856,612,141 |
| ගොඩනැගිලි | 1,200,179,737 | 1,128,693,563 |
| අධිබලැති විදුලි කුළුණු | 2,745,951 | 3,443,716 |
| අධිබලැති විදුලි බල්බ | 572,340 | 995,362 |
| යන්ත්‍ර සහ උපකරණ | 130,301,157 | 134,025,856 |
| පරිගණක | 4,086,262 | 718,350 |
| මෝටර් රථ | 5,227,014 | 9,792,824 |
| ක්‍රීඩා උපකරණ | 38,587,037 | 40,463,816 |
| ලී බඩු සහ උපකරණ | 13,670,484 | 1,066,078 |
| කාර්යාලීය සහ අනෙකුත් උපකරණ | 8,370,779 | 8,604,977 |
| තිර රෙදි | 191,266 | 2 |
| සිදු කෙරෙමින් පවතින වැඩ | 196,215,775 | 223,247,474 |
| ස්ථාවර තැන්පත් | 29,671,032 | 29,605,530 |
| | **4,486,430,975** | **4,437,269,689** |
| **සමස්ථ වත්කම්** | **4,709,166,215** | **4,574,872,164** |
| **ප්‍රාග්ධන ස්කන්ධය සහ වගකීම් - ජංගම වගකීම්** | | |
| වෙළඳ ණය හිමියෝ | 4,936,741 | 848,197 |
| ආරක්ෂිත තැන්පතු | 7,495,173 | 3,928,229 |
| ලැබූ අත්තිකාරම් මුදල් | 4,718,477 | 1,178,550 |
| බදු වෙන් කිරීම | 340,803 | 217,102 |
| උපචිත වියදම් හා අනෙකුත් ගෙවිය යුතු වියදම් | 17,130,485 | 7,725,797 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 50,696,343 | 43,354,895 |
| | **85,318,021** | **57,252,770** |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂික දීමනා | 40,641,609 | 38,230,005 |
| | **40,641,609** | **38,230,005** |
| **සමස්ථ වගකීම්** | **125,959,630** | **95,482,775** |
| **ශුද්ධ වත්කම්** | **4,583,104,599** | **4,479,389,390** |
| **ශුද්ධ වත්කම්/ප්‍රාග්ධන ස්කන්ධ** | | |
| රජයේ ප්‍රදාන | 5,742,371,609 | 5,567,371,609 |
| සමුච්චිත අරමුදල | (1,097,191,589) | (1,016,856,744) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 9,334,652 | 9,334,652 |
| වර්ෂයේ අතිරික්ත / ඌණතාවය | (71,308,087) | (80,460,127) |
| **මුළු ප්‍රාග්ධන ස්කන්ධ සහ වගකීම්** | **4,583,206,585** | **4,479,389,390** |

# අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

## 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2014.12.31 (රුපියල්) | 2013.12.31 (රුපියල්) |
|---|---|---|
| **මෙහෙයුම් වලින් ලද මුදල් ප්‍රවාහය** | **(71,308,087)** | **(80,460,127)** |
| **බදු පෙර අතිරික්තය හෝ ශුද්ධ ඌණතාවය** | | |
| | | |
| සමුච්චිත අරමුදලට පසුගිය වසර වල කරන ලද ක්ෂය ගැලපීම් | | |
| ක්ෂය වෙන්කිරීම් | 88,122,823 | 80,132,397 |
| පසුගිය වසර වල කරන ලද ක්ෂය ගැලපීම් | - | - |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - |
| පාරිතෝෂික වෙන් කිරීම් | 3,548,586 | 7,847,352 |
| | | |
| (වැඩිවීම්) / අඩුවීම් තොග | 956,952 | (364,656) |
| (වැඩිවීම්) / අඩුවීම් ලැබිය යුතු ශේෂය | (17,672,564) | 165,559 |
| වැඩිවීම් / (අඩුවීම්) ගෙවිය යුතු ශේෂය | 28,065,251 | 8,972,296 |
| පාරිතෝෂිත දීමනා ගෙවීම් | (1,136,983) | (2,616,663) |
| **මෙහෙයුම්වලින් ලද ශුද්ධ මුදල් ශේෂය** | **30,575,977** | **13,676,157** |
| | | |
| ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| දේපල, පිරියත සහ යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම් | (137,218,604) | (93,941,869) |
| බදු ගෙවීම් | - | - |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | (65,501) | (76,192) |
| **ආයෝජන කටයුතුවලින් ලද මුදල් ශේෂය** | **(137,284,105)** | **(94,018,062)** |
| **මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| සමුච්චිත අරමුදලෙහි වෙනස්වීම් | 125,282 | 164,979 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 175,000,000 | 91,466,401 |
| **මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ශේෂය** | **175,125,282** | **91,631,379** |
| | | |
| මුදල් හා මුදල් සමාන දෑ වලින් ශුද්ධ වැඩිවීම | 68,417,154 | 11,289,475 |
| වර්ෂ ආරම්භයේදී මුදල් හා මුදල් වලට ආසන්න දෑ | 17,498,861 | 6,209,386 |
| **වර්ෂ අවසානයේදී මුදල් හා මුදල් වලට ආසන්න දෑ ශේෂය** | **85,916,015** | **17,498,861** |

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

# විගණකාධිපති වාර්තාව
# 2014

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්/ඒ/එස්එන්එස්සීඒ/එෆ්ඒ/2014 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2015 නොවැම්බර් 12 දින

සභාපති,

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 9 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2015 ජූනි 22 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2887028-34 +94 11 2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

AGDSL



## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක් සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවෙ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

දීර්ඝකාලීනව අයනොවී පවතින ණයගැති ශේෂ සම්බන්ධයෙන් අඩමාන ණය සඳහා වෙන් කිරීමේ ප්‍රතිපත්තියක් අධිකාරිය විසින් හඳුන්වාදී නොතිබීම හේතුවෙන් වර්ෂ 5 ට වඩා කල්ගතවී ඇති රු.35,059,518 ක් වූ ණයගැති ශේෂ සම්බන්ධයෙන් වෙන්කිරීම් කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ජංගම වත්කම් හා ශුද්ධ ඌනතාවය පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 07

මීටර 400 කෘතිම ධාවන පථය ඇතිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.112,582,167 ක් ගෙවා තිබුණද ධාවන පථය භාවිතයට ගත නොහැකි ලෙස හානි වී තිබුණි. එහෙත් ප්‍රමිතියේ 80 හා 81ඡේදය ප්‍රකාරව ධාවන පථය වත්කම් වලින් ඉවත්කර, ඒ තුලින් වන අලාභය සමාලෝචිත වර්ෂයේ ඌනතාවයට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩ නිමකල රු.148,406,912 ක ව්‍යාපෘති පිරිවැය ප්‍රාග්ධනීත නොකර කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබූ අතර ඒ හේතුවෙන් එම වත්කම් වලට අදාළ ක්ෂය වෙන්කිරීම්ද සිදුකර නොතිබුණි.

(ආ) 2012 හා 2013 වර්ෂවලදී සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ශාහස්ථ, එළිමහන් ක්‍රීඩාංගන සහ පිහිණුම් තටාකය, ක්‍රීඩා තරඟ හා උත්සව පැවැත්විමට වෙන්කරවා ගැනීම වෙනුවෙන් අධිකාරියට ආයතන පහකින් ලැබිය යුතු රු.3,498,073 ක් ආදායම් ගිණුම් වලට ගෙන නොතිබුණි.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්
-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ක්‍රීඩා සංගම් හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු ශේෂ, 2014 වර්ෂයේ අදාළ ආයතනවල මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති ශේෂයන් සමග සැසඳීමේදී පහත වෙනස්කම් නිරීක්ෂණය විය. මෙම වෙනස්කම් වලට හේතුන් අනාවරණය කර නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

| ආයතනය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | |
|---|---|---|
| | අදාල ආයතනයේ ගිණුම් අනුව ශේෂය | අධිකාරියේ ගිණුම් අනුව ශේෂය |
| | රු. | රු. |
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | ශේෂයක් නැත | 1,562,870 |
| ශ්‍රී ලංකා ක්‍රිකට් | 20,773,845 | 25,753,845 |
| ශ්‍රී ලංකා අත්පන්දු සංගමය | 987,449 | 2,344,757 |
| ශ්‍රී ලංකා පාපන්දු සංගමය | 293,249 | 3,291,433 |
| ශ්‍රී ලංකා බිලියඩ් ඇන්ඩ් ස්නූකර් සංගමය | ශේෂයක් නැත | 18,434 |

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ ශේෂය එයට අදාළ උප ලේඛනය සමඟ සැසඳීමේදී රු.101,986 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල සඳහන් පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම් හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | කලින් ලද ආදායම් | 136,444 | ආදායම් විස්තර |
| (ආ) | ලැබිය යුතු ශේෂ | 14,923,867 | ඍජු ශේෂ සනාථන |
| (ඇ) | ණයහිමි ශේෂ | 4,936,741 | ඍජු ශේෂ සනාථන, කාල විශ්ලේෂණ |
| (ඈ) | වෙනත් ගෙවිය යුතු ශේෂ | 23,804,113 | උපලේඛන |
| (ඉ) | ගෙවිය යුතු තැන්පතු | 7,495,173 | කාල විශ්ලේෂණ |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතන 03 කින් අයවිය යුතු වර්ෂයකට වැඩි ශේෂ එකතුව රු. 2,311,110 ක් වූ අතර ආයතන 13 කින් ලැබිය යුතු වර්ෂ 5 ඉක්මවූ ණයගැති ශේෂ එකතුව රු.35,059,518 ක් අයකර ගැනීමට අධිකාරිය විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ සිට ආයතන 3 කින් අයවිය යුතු රු.2,248,900 ක විවිධ ණයගැති ශේෂයන් අයකර ගැනීමට අධිකාරිය විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) විවිධ ණයගැති වෙනත් ශේෂයන් යටතේ දක්වා තිබූ පුද්ගලික ආයතන 04 කට අනුමැතියකින් තොරව ණය පදනම මත සපයා තිබූ සේවා වෙනුවෙන් අයවිය යුතු එකතුව රු.768,604 ක ශේෂයන් අයකර ගැනීමට අධිකාරිය විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට රු. 44,057,831 ක් වූ ලැබිය යුතු වැට් බදු වටිනාකම අයකර ගැනීමට අධිකාරිය ක්‍රියා කර නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

6

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104(2) | පාඩු හා හානි සම්බන්ධයෙන් විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 110 | පාඩු හා හානි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 366 (ඇ) | නිකුත් කල නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 6 ඉකුත් වූ එකතුව රු.251,655 ක චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 395(ඇ) | සෑම මාසයකම බැංකු සැසඳුම් ඊලඟ මාසයේ 15 වන දිනට පෙර පිළියෙල කල යුතු වුවද බැංකු සැසඳුම් එපරිදි පිළියෙල නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 754 | මුදල් වර්ෂයක් අවසානයේදී, බඩු වට්ටෝරු පොත් තුලනය කර යාවත්කාලීනව පවත්වාගෙන යායුතු වුවත්, එලෙස කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (vi) මුදල් රෙගුලාසි 755(1) | රාජකාරි අත්හැරීමට, මාරුවක් ලැබ යාමට නැතහොත් දීර්ඝ නිවාඩුවක් ලැබ යාමට පෙර, ඔහු විසින් ඔහුගේ අනුප්‍රප්තිකයාට හෝ එම කාර්යය පවරනු ලැබ සිටින වෙන ඕනෑම නිලධාරියෙකුට හෝ තම වගකීම යටතේ ඇති සියලුම රජයේ භාණ්ඩ හා වෙනත් දේපල බාර දී ඒවා බාරදෙන නිලධාරියාගෙන් ඒවා ලැබුණු බවට පිටපත් දෙකකින් යුක්ත කුවිතාන්සියක් ලබාගත යුතු වුවද එවැනි අවස්ථාවලදී අධිකාරියේ නිලධාරීන් විසින් දීර්ඝකාලීනව එසේ ක්‍රියාකර නොතිබුණි. |
| | (vii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ 2015 ජුනි 24 දින දක්වා සිදුකර නොතිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 | අනුමත වාර්ෂික අයවැය ලේඛනය වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 18 දිනැති අංක අයිඒඅයි/1/2002/02දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක හා මෘදුකාංග සඳහා වෙනම ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඈ) | 2006 ජනවාරි 25 දිනැති අංක 8 දරණ ප්‍රසම්පාදන නියෝජ්‍ය ආයතන චක්‍රලේඛය | මිලදී ගැනීම් පිරිවිතරයන් ආයතනයේ සැලසුම්කරුවන් හෝ තාක්ෂණික නිලධාරීන්ගේ නිර්දේශය මත තීරණය කල යුතු වුවද වර්ෂය තුළ එකතුව රු.2,323,873 ක මිලදී ගැනීම් පුද්ගලික ආයතන වල පිරිවිතර හා නිර්දේශ මත ආයතන තුනකින් මිලදී ගෙන තිබුණි. |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

8

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.71,308,087 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.80,466,127 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,152,040 ක වර්ධනයක් පෙන්නුම් කරයි. මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් ගෘහස්ත ක්‍රීඩාංගනයේ ආදායමේ රු. 29,816,738 ක වැඩිවීම බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂ ගණනාවක සිට ආයතනයේ ඌනතාවය ක්‍රමිකව වර්ධනය වී තිබූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් සේවක වැටුප්, දීමනා හා වෙනත් පොදු කාර්ය වියදම් වල වැඩිවීම බලපා තිබුණි. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරකට අදාල මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විස්තර පහත පරිදි විය.

| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| මෙහෙයුම් ආදායම | 131,309,826 | 143,868,569 | 155,573,543 | 185,831,160 | 235,593,748 |
| වෙනත් ආදායම් | 646,369 | 719,628 | 906,139 | 2,226,688 | 1,268,724 |
| මුළු වියදම | 215,279,331 | 218,086,661 | 238,463,753 | 268,282,087 | 308,046,858 |
| බදු වියදම් | 63,097 | 70,164 | 70,164 | 235,887 | 123,701 |
| අතිරික්තය/(ඌනතාවය) | (83,386,233) | (73,568,628) | (82,054,235) | (80,460,127) | (71,308,087) |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

9

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රීඩා හෝටල භාවිතය හා අයකාවන් කළමනාකරණය

(i) අධිකාරියට අයත් කාමර 42 කින් සමන්විත ක්‍රීඩා හෝටලයේ කාමර 3 ක් වර්ෂයක පමණ කාලයක සිටද වර්ග අඩි 800 ක පමණ බිම හල වර්ෂ 8 ක පමණ කාලයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අධිකාරියට ලබාගත හැකිව තිබූ කුලී ආදායම් අහිමිවී තිබුණි.

(ii) 2010 නොවැම්බර් 15 දින සිට වර්ෂ 3 ක කාලයක් සඳහා වර්ෂයකට රු. 9,120,000 ක කුලියකට බාහිර පාර්ශ්වයකට ක්‍රීඩා හෝටලය කුලියට දීමට ගිවිසුමකට එළැඹ තිබුණද 2011 මාර්තු 23 දින අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එය අවලංගු කර අධිකාරියේ කළමනාකරණය යටතේ හෝටලය පවත්වාගෙන යාමට තීරණය කිරීම හේතුවෙන් 2011, 2012, 2013 වර්ෂවල අධිකාරියට රු.මිලියන 15 ට ආසන්න ආදායමක් අහිමි වී තිබුණි. තවද හෝටලයේ කාමර 42 හි දෛනික කාමර දින 15,330 ක පහසුකම් පැවතියද වර්ෂය තුල උපයෝජනය වී තිබුණේ කාමර දින 4,157 ක් හෙවත් සියයට 27 ක් පමණි.

(iii) වර්ෂ 10 කට ආසන්න කාලයක් ක්‍රියාත්මකවී නොතිබූ වර්ග අඩි 990 කින් සමන්විත ආපනශාලාව, 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛය අනුව සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරාගැනීමේදී ඉටුකල යුතු අවශ්‍යතාවන් ඉටුකිරීමෙන් තොරව 2015 වර්ෂයේදී රු.40,000 ක මාසික කුලියකට බදු දී තිබූ ආපනශාලාව බදු කාලය අවසන් වීමෙන් අනතුරුවද කොන්ත්‍රාත්කරු විසින් පවත්වාගෙන ගොස් තිබුණි. තවද කොන්ත්‍රාත් ගිවිසුමෙහි සඳහන් වර්ග අඩි 990 වඩා වර්ග අඩි 214 ක් ආපනශාලාවේ කටයුතු සඳහා පරිහරණයට ඉඩ දී තිබුණි.

(iv) කාමර සහනදායී කුලියට දීමෙන් වාර්ෂිකව ලබන රු.මිලියන 7.8 ක කුලී ආදායමට වඩා වැඩි ආදායමක් කාමර, උත්සව ශාලා, රැස්වීම් ශාලා කුලියට දීමෙන් අධිකාරියට ලබාගත හැකි වුවද ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department



(v) ක්‍රීඩා හෝටලය තරු තුනේ හෝටලයක් ලෙස පවත්වාගෙන යාම හා පැවරීමේ පදනම මත යලි ඉදිකිරීම සඳහා (Build Operate and Transfer - BOT) ජපන් සමාගමත් හා අධිකාරිය අතර අවබෝධතා ගිවිසුමක් සකස්කර එය ජපන් සමාගමට යවා මේ වන විට වර්ෂ දෙකකට ආසන්න කාලයක් ගතවී තිබුණද ඒ සම්බන්ධයෙන් පසුවිපරම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වාහන කුලී, රථගාල කළමනාකරණය

----------------------------------------

අධිකාරියට අයත් හෙක්ටයාර් 1.13 කට අධික භූමි ප්‍රමාණයක පිහිටි වාහන කුලී නැවතුම්පොලෙහි ඇතුලත්වීමේ ප්‍රවේශ පත්‍ර පමණක් මිලදී ගෙන රථගාල තුළ නවත්වා තිබූ ඇතැම් වාහන වර්ෂ 2 කට අධික කාලයක් ගත වී තිබුණද එම වාහන වලින් අධිකාරියට අයවිය යුතු ගාස්තු අයකර ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර එම වාහන අනවසර ලෙස රඳවා තැබීමෙන් රු.704,049 ක ආදායමක් අහිමි වී තිබුණි. තවද අධිකාරිය විසින් CCTV කැමරා පද්ධතියක් සවිකර තිබුණද එයින් වර්ෂයකට රු.මිලියන 13 කට අධික ආදායමක් ලැබෙන රථගාල නිසි පරිදි ආවරණය වනසේ ස්ථාපිත කර නොතිබුණි.

4.2 දූෂණ වංචනික ගනුදෙනු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් ලැබීම් සහ එම මුදල් බැංකු ගත කිරීම් පරීක්ෂා කිරීමේදී, අධිකාරියේ මුදල් අයකැමි විසින් රු. 800,000 මුදලක් බැංකුගත නොකර වංචාකර තිබුණි.

(ආ) අධිකාරිය සතු කාර් රථ දෙකක්, ජීප් රථයක් හා කැබ් රථයක් රියදුරන් සමග අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකු, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු සහ අමාත්‍යවරයාගේ ආරක්ෂක අංශ නිලධාරියෙකු විසින් භාවිතා කර තිබූ අතර වාහනවල අලුත්වැඩියා වියදම් වශයෙන් එකතුව රු. 2,998,587 ක වියදමක් අධිකාරිය විසින් දරා තිබුණි. මෙයින් එක් වාහනයක් ජනාධිපතිවරණ මැතිවරණ කටයුතුවල නිරතව සිටියදී 2014 දෙසැම්බර් 18 දින අනතුරකට පත්වී තිබුණි.

(ඇ) විගණන නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද මාස දෙකකදී සභාපති කාර්යාලයේ සේවයේ නියුතු කාර්යාල කාර්ය සහායකයෙකු ව්‍යාජ ලෙස පැමිණීම හා පිටවීම සටහන් කර කළ වැඩ විස්තර ඉදිරිපත් කිරීමකින් තොරව අතිකාල ලෙස රු.28,063 ක් ලබාගෙන තිබුණි.

4.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-----------------------------------

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මීටර 400 කෘතිම ධාවන පථයේ ඉදිකිරීම. කොන්ත්‍රාත්තුගත මුදල රු.126,799,400

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව පරිදි මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන නොමැති බව දක්වමින් ප්‍රසම්පාදන කමිටුව විසින්, පළමු ලංසු කැඳවීමේදී තෝරාගත් කොන්ත්‍රාත් සමාගම අවලංගු කර නැවත ලංසු කැඳවා පෙර පළපුරුද්ද නොතිබුණු කොන්ත්‍රාත්කරුවකු ඉදිකිරීම් සඳහා තෝරාගෙන තිබූ අතර ඉදිරිපත් වූ ලංසු අතරින් ආයතන දෙකක ලංසු ද්විතික ඇගයීම සඳහා සලකා බලා නොතිබුණි.

(ආ) ධාවන පථයේ වැඩ 2012 අප්‍රේල් 21 දින නිමකර තිබුණද සති දෙකක් වැනි කෙටි කාලයක් තුල ධාවන පථයේ පළමු සහ දෙවන ස්ථර වලට හානි සිදුවී තිබුණි. විගණනයෙන් 2014 නොවැම්බර් 24 දින ධාවන පථය පරීක්ෂා කිරීමේදී ධාවන පථයේ පළමු සහ දෙවන ස්ථර මුළුමනින්ම ගැලවෙමින් පවතින බවත් Asphalt ස්ථර දක්වා ජලය කාන්දු වන බව හා ධාවන පථය ක්‍රීඩා ඉසව් සඳහා භාවිතා කිරීමට නොහැකි තත්වයක පවතින බවත් නිරීක්ෂණය විය.

(ඇ) ධාවන පථයේ ඇති වූ දුර්වලතාවයන් මත අවසාන බිල්පත සහ රඳවාගැනීමේ අත්තිකාරම් මුදල් ගෙවීම අත්හිටුවා තිබුණද, ක්‍රීඩා අමාත්‍යවරයාගේ විශේෂ නිර්දේශයක් මත 2014 ජූනි 24 දින රු.මිලියන 5 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු අතර මෙම ගෙවීම මුදල් රෙගුලාසි 136,137,138,139 හා 156 ට පටහැනිව සිදුකර තිබුණි.

(ඇ) මෙම ඉදිකිරීම් කටයුත්තට උපදේශක සේවා ලබාදීම සඳහා පත්කළ සිවිල් ඉංජිනේරුවරයාට සහ අධ්‍යක්ෂක හට (ඉංජිනේරු සේවා) ධාවන පථ ඉදිකිරීම සම්බන්ධයෙන් පළපුරුද්දක් හෝ වෘත්තීමය කුසලතාවයක් නොමැති බව අනාවරණය වූ අතර ඉදිකිරීම සම්බන්ධයෙන් මොරටුව විශ්ව විද්‍යාලයෙන් ලබාගත් තාක්ෂණික වාර්තාව අනුව වැසි සහිත කාලගුණ තත්වයකදී ඉදිකිරීම සිදු කිරීම නිසා ඇතිවූ රසායනික ප්‍රතික්‍රියා ධාවන පථයේ ප්‍රමිතියට බලපා තිබීම, ධාවන පථය එළීමේදී විශේෂඥ දැනුම සහ සුදුසු ඉංජිනේරුමය අධීක්ෂණයක් නොමැති වීම මේ සඳහා අහිතකාරී ලෙස බලපා ඇති බව දක්වා තිබුණි.

(ඉ) ටෙන්ඩර් ලේඛනයේ කාණ්ඩ අංක 6 හි 1.10 ඡේදය මගින් 2010 මාර්තු මස 01 දින ජාත්‍යන්තර මළල ක්‍රීඩා සංගමය පිළිගත් පළමු සහ දෙවන පංතියේ සහතිකය ලත් ද්‍රව්‍ය භාවිතා කරමින් පෙරනිමි (Pre Fabricated ) ක්‍රමයට හෝ Full Pour ක්‍රමයට ධාවන පථය සකස් කල යුතු බව දක්වා තිබූ කොන්දේසිය ඉවත් කර තිබුණද එය ලංසු ලේඛන මිලදී ගත් ලංසුකරුවන් වෙත සන්නිවේදනය කර නොතිබුණි. තවද පළමු තත්ත්වයේ ධාවන පථයක් ලෙස මෙම ඉදි කිරීම සිදුකර තිබුණද එවැනි ධාවන පථ අවශ්‍ය වනුයේ ලෝක ශූරතා තරඟාවලි සහ ඔලිම්පික් තරඟාවලි සඳහා පමණක් බව නිරීක්ෂණය විය.

## 4.4 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනික සම්පත් සැලසුම් කිරීමේ පද්ධතියක් (Enterprise Resource Planning System) ස්ථාපිත කිරීමට අදාලව මිලදීගෙන තිබූ පිරිවැය රු. 2,908,160 ක්වූ පරිගණක 16 කට මෘදුකාංග දත්ත ඇතුලත් කර නොතිබුණු අතර රු. 472,103 ක්වූ සර්වරයද (Sever) ප්‍රයෝජනයට නොගෙන තිබුණි.

(ආ) ක්‍රීඩා හෝටලය පවත්වාගෙන යනු ලබන රු.1,020,000,000 ක වර්තමාන වෙළඳපොළ තක්සේරු වටිනාකමක් ඇති ඉඩම සහ ගොඩනැගිල්ල වසර 30 ක් සඳහා එකවර බද්දකට දෙන්නේ නම් අයකල යුතු බදු මුදල රු.783,870,000 ලෙස තක්සේරු කර තිබුණි. මේ අනුව අදාල වත්කම බද්දට දීමෙන් වර්ෂයකට රු.26,129,000 ක් ලබාගත හැකිව තිබියදී එය බදුනොදී අධිකාරිය විසින් හෝටලය පවත්වාගෙන ගොස් තිබුණද අධිකාරිය පසුගිය වර්ෂ හතරක කාලය තුල ක්‍රීඩා හෝටලයෙන් ලැබී තිබූ සාමාන්‍ය ලාභය රු.මිලියන 4 ක් පමණි.

(ආ) පිරිවැය රු 1,063,823 ක් වූ තොග අයිතම 102 ක් වසර 5 කට අධික කාලයක් භාවිතයට නොගෙන ගබඩාව තුළ රඳවා තිබුණි.

4.5 අධිකාරිය සතු සම්පත් වෙනත් පාර්ශවයන්ට ලබාදීම
--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රියදුරෙකු හා කාර්යාල කාර්යය සහායකයකු අමාත්‍යාංශයටද කළමණාකරන සහකාර සේවයේ නිලධාරියෙක් හා ආරක්ෂක නියාමකයකු අමාත්‍යවරයාගේ කාර්යාලයේ රාජකාරි සඳහාද යොදවා තිබූ අතර, ඔවුන්ගේ වැටුප් හා අතිකාල දීමනා වෙනුවෙන් පිළිවෙලින් රු.1,030,083 ක්, රු.391,033 ක් හා සංයුක්ත දීමනා වෙනුවෙන් රු.20,912 ක අධිකාරිය විසින් දරා තිබුණි.

(ආ) රුස්වීමක් සහ උත්සවයක් සඳහා පැයකට රු. 2,000 ක් බැගින් කුලී ආදායම් ඉපයිය හැකි ක්‍රීඩා හෝටලය සතු උත්සව ශාලාවක්, 2011 ජුලි 12 දින සිට කුලී අයකිරීමෙන් තොරව ක්‍රීඩා සංගමයකට ලබාදී තිබුණි.

4.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
-------------------------------

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ එළිමහන් ගෘහස්ථ ආපනශාලාවක් බදු දීමේදී සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර තිබූ ලංසුකරුවකුට රු. 55,000 ක මාසික කුලියකට ආපන ශාලාව බදු දී තිබුණි. තවද ලංසුකරු ඉදිරිපත් කර තිබූ ලංසු ලේඛනවල දිනයන්ද පරස්පර විය.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය
---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට වූ අනුමත සේවක සංඛ්‍යාව 328 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 305 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 23 ක් විය.

(ආ) අනුමත කාර්යය මණ්ඩලයේ නොමැති තනතුරු 06 ක් සඳහා නිලධාරීන් 19 දෙනෙකු අනුයුක්ත කර තිබුණු අතර කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව තනතුරු 10 ක් සඳහා නිලධාරීන් 30 දෙනෙක් බඳවා ගෙන තිබුණි.

(ඇ) ආරක්ෂක නියාමක සහ ක්‍රීඩාංගන සහයක තනතුරු වලට බඳවාගෙන තිබු නිලධාරින් 54 දෙනෙක් අදාල රාජකාරියෙන් බැහැරව වෙනත් රාජකාරි සඳහා අනුයුක්ත කර තිබුණි.

(ඈ) බඳවා ගැනිම් පරිපාටියට අනුව සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) තනතුරට ක්‍රීඩා විෂය ඇතුලත් ප්‍රථම උපාධිය සමග අදාල ක්ෂේත්‍රයේ වසර තුනක (03) සේවා පළපුරුද්දක් තිබිය යුතු වුවද එයට පටහැනිව සුදුසුකම් නොමැති නිලධාරියකු බඳවාගෙන තිබූ අතර වෘත්තිය සුදුසුකම් හා සේවා පළපුරුද්දක් නොමැති ක්‍රීඩා නිලධාරින් හයදෙනකු බඳවාගෙන තිබුණි.

4.8 පාඩු හා හානි
--------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ප්‍රධාන පීඨිකාවේ ඉහල වහලයේ සවිකර තිබුණු අකුණු සන්නායකය අතුරුදහන් වී තිබුණු අතර ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂයට අදාල එකතුව රු. 2,476,769 ක් වූ එකතු කල අගය මත බදු නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් රු. 833,768 ක දඩ මුදලක් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
-------------------------------------

5.1 අභ්‍යන්තර විගණනය
------------------------

සමාලෝචිත වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය
---------------------------

ආයතනයේ අයවැයගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL



5.3 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව, මූල්‍ය හා භෞතික ඉලක්කයන් කාලීනව ඉටුකර ගැනීම තහවුරුවීමට සහ වෙන් කරන ලද අරමුදලේ ඵලදායී උපයෝජනය වැඩි කර ගැනීම සඳහා වර්ෂය අවසානයේ වගකීම් දක්වමින් අයවැය පදනම් කර ගෙන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් කාර්යයන් සඳහා වගකිවයුතු නිලධාරින් හඳුනාගෙන නොතිබුණු අතර ක්‍රියාකාරී සැලැස්ම ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් අධිකාරිය විසින් හඳුන්වා දී නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ගිණුම්කරණය

(ඇ) ණයගැතියන් පාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය

(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය

(උ) තොග පාලනය

(ඌ) අයවැය පාලනය

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

# 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ යාවත්කාලීන කරන ලද තොරතුරු

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

- ❖ කාල විශ්ලේෂණය කර ඇත.
- ❖ අඩමාන ණය වෙන්කිරීමක් කර ඇත.
- ❖ රාජ්‍ය අංශය, පුද්ගලික අංශය හා ක්‍රීඩා සංගම් වශයෙන් වර්ගීකරණය කර ඇත.
- ❖ රාජ්‍ය හා ක්‍රීඩා සංගම්වලට අවශ්‍ය ලිපි යවා රුපියල් මිලියන තුනකට ආසන්න අගයක් අය කරගෙන ඇති අතර පුද්ගලික අංශය සඳහා එන්තරවාසි යැවීමට පියවර ගෙන ඇත.

2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.

- ❖ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත නොකර කෙරීගෙන යන වැඩ යටතේ ගිනුම්ගත කර ඇත.
- ❖ ලාභාලාභ ගිණුමේ වෙන්කිරීමක් සිදු කර ඇත.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු.

(අ) වැඩ නිමකළ බවට සහතිකයක් (Completion Certificate) අදාළ රජයේ ආයතනවලින් මෙතෙක් ලැබී නොමැති අතර කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇත.

(ආ) මේ පිළිබඳව කළමනාකාරීත්ව මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර අය කරගැනීම සඳහා ඉහත 2.2.1 පියවර අනුගමනය කර ඇත.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්.

(අ) අදාල ක්‍රීඩා සංගම් හා දෙපාර්තමේන්තු සමග සැසඳීම් කර නිවැරැදි කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත.

(ආ) සැසඳීම් කර නිවැරැදි කර ඇත.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

- ❖ (අ) සිට (ඉ) දක්වා ආදායම් විස්තර, කාල විශ්ලේෂණය, උප ලේඛන යන අයිතමයන් සැකසීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.

- ❖ (අ) සිට (ආ) දක්වා අය කරගැනීම සඳහා ඉහත 2.2.1 පියවර අනුගමනය කර ඇත. තවද 2010 වසරට පෙර සිට පැවැත එන රුපියල් 5,000 ට අඩු වටිනාකම් සහිත රාජ්‍ය ආයතනවලින් අය විය යුතු අගයන් ලියා හැරීමටත් කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

(ඇ) මහාභාණ්ඩාගාරය විසින් ව්‍යාපෘති සඳහා නිදහස් කරන මුදල්වලින් වෙන් කරන වැට් බදු වටිනාකම ලැබිය යුතු මුදලක් ලෙස සලකා කටයුතු නොකිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලැබීමෙන් අනතුරුව එය අධිකාරියේ වත්කමක් ලෙස සලකා කටයුතු කිරීමට ක්‍රියාකර ඇත.

2.4 නීතිරීති, රෙගුලාසි හා කලමනාකරණ තිරණවලට අනුකූල නොවීම.

- ❖ (අ) (i) සිට (vii), (අ), (ආ), (ඇ), (ඈ) දක්වා ඇති අඩුපාඩු පිළිබඳව සියලුම අංශ ප්‍රධානීන් දැනුවත් කර ඇති අතර නිවැරැදි කර ගැනීමට කටයුතු කර ඇත.

4.1 කලමනාකරණ අකාර්යක්ෂමතා.

(අ) ක්‍රීඩා හෝටලය භාවිතය හා අයතාවත් කලමනාකරණය.

(i) ක්‍රීඩා හෝටලයේ ඇතැම් ස්ථාන නඩත්තු කළයුතු තත්ත්වයක පැවැතීමෙන්, භාවිතා කළ නොහැකි තත්ත්වයක පැවැතුණි. මේ වනවිට ක්‍රීඩා හෝටලයේ නවීකරණ කටයුතු සිදු කරමින් පවතී.

(ii) නවීකරණය කිරීමට සැලැසුම් කර තිබුණි. මේ වන විට මුලුමුනින්ම නවීකරණය සඳහා කටයුතු කරනු ලබයි.

(iii) අය කරගැනීම් සිදු කිරීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

(iv) නවීකරණය සඳහා සැලැසුම් කර තිබුණි. පහසුකම් සලසා ගැනීමෙන් පසු ආදායම් ඉපැයීමට කටයුතු සැලැසුම් කර ඇත.

(v) අවබෝධතා ගිවිසුම බල රහිත වී ඇති අතර මේ වන විට ක්‍රීඩා හෝටලයේ නවීකරණය හා අලුත්වැඩියා කටයුතු මූලධන ව්‍යාපෘති යටතේ ඉටුවෙමින් පවතියි.

(ආ) වාහන කුලි, රථගාල කළමනාකරණය.

- ❖ මෙම රථගාල ආවරනය කිරීමට කැමරා දහයක් සවිකර ඇති අතර එමගින් ගාල් කරන ලද සෑම රථයක්ම හඳුනාගත හැකි අතර රථගාලට පිවිසෙන හා පිටවෙන වාහන ආවරණය කිරීම සඳහා කැමරා දෙකක් සවිකර ඇත. එම නිසාවෙන් රථගාලෙ සියලුම සිදුවීම් නිරීක්ෂණය කිරීමේ හැකියාවක් තිබේ.

4.2 දූෂ්‍ය වංචනික ගනුදෙනු.

(අ) මූල්‍ය වංචාවන් සිදු කරන ලද මුදල් අයකැමි සම්බන්ධව මූලික විමර්ශණ හා විධිමත් පරීක්ෂණ පවත්වා ඔහු සේවයෙන් ඉවත් කිරීමට විනය ක්‍රියාමාර්ග ගන්නා ලදි. මුදල් ලැබීම් හා එම මුදල් බැංකු ගතකිරීම්වලට අදාළ නව ක්‍රමවේද සකස් කර පවත්වාගෙන යාමට මූල්‍ය අංශයට ලිඛිත උපදෙස් ලබා දී ඇත.

(ආ) මේ වන විට සංචිතයේ වාහන යෙදවීම් ක්‍රමානුකූලව සිදු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. අධිකාරියේ රිය අනතුරුවලට පත් වූ වාහන සඳහා රක්ෂණ සමාගම්වල මුදල්වලින් පිළිසකර කර ඇත. මුදල් රෙගුලාසිවලට අනුව පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර ඇත.

(ඇ) සේවකයින් නිසි පරිදි අංශයන්හි සේවයේ යෙදවීමට හා අතිකාල රාජකාරීන්හි නිරත කරවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

4.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු.

(අ) රුපියල් මිලියන 100කට වැඩි ව්‍යාපෘතියක් බැවින් ප්‍රසම්පාදන කටයුතු ඉටුකරන ලද්දේ ක්‍රීඩා අමාත්‍යාංශය මගිනි.

(ආ) ධාවන පථයේ වැඩ නිම කිරීමෙන් පසුව ඇති වූ ගැටළුකාරී තත්ත්වය පිළිබඳව නීතිපති උපදෙස් අපේක්ෂා කරන ලදි. මෙහිදී කොන්ත්‍රාත් ආයතනය විසින් නිසි ප්‍රමිතියට අනුව කාර්යය ඉටුකර නොමැති බැවින් නීති ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත්, නැවත මෙම ධාවන පථය නැවත ඇතිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස නීතිපති දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී ඇත.

(ඇ) කොන්ත්‍රාත්තුව අවසන් වීමෙන් පසු රඳවාගැනීමේ මුදල් වශයෙන් තබාගන්නා මුදලට වඩා වැඩි මුදලක් මෙම ව්‍යාපෘතියෙහි රඳවා ඇත.

(ඈ) මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ඉ) ප්‍රසම්පාදන කටයුතු ඉටුකරන ලද්දේ අමාත්‍යාංශය මගින් වන අතර මේ වන විට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

(අ) ආයතනයේ අවශ්‍ය අංශයන්හි සියලුම පරිගණක සඳහා සම්පත් සැලසුම් කිරීමේ පද්ධතිය මෘදුකාංග දත්ත ඇතුළත් කර අවසන් අතර ඊට අදාල සර්වරය (Server) පරිහරණය කරනු ලබයි.

(ආ) නවීකරණයෙන් පසු විධිමත් ක්‍රමවේදයක් යටතේ බදුදීමට ක්‍රියා මාර්ග ගෙන ඇත.

(ඇ) මෙම භාණ්ඩයන් මේ වන විට පරිහරණය කර ඇත.

4.5 අධිකාරිය සතු සම්පත් වෙනත් පාර්ශවයන්ට ලබා දීම.

(අ) සේවකයින් කඩිනමින් අධිකාරියට අනියුක්ත කරවාගන්නා ලදි. සේවක අනියුක්ත කිරීම් විධිමත් කර ඇත.

(ආ) රජයේ අවශ්‍යතාවය පරිදි රේස් කෝස් ක්‍රීඩාංගනයේ නවීකරණ කටයුතු සිදුකර ඇති අවධියේ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් විසින් ක්‍රීඩා පහසුකම් මෙම සංගමයට තාවකාලිකව ලබා දීමට ලිඛිතව දන්වා ඇත. ක්‍රීඩා පහසුකම් සැපයීම මෙම අධිකාරියේ වගකීම බැවින් මෙසේ සිදුකර ඇත.

4.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු.

❖ මෙහි විගණන විමසුමට අදාලව සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ තෝරාගත් ලංසුකරු නොව අනෙක් ලංසුකරු වන සම්පත් බේකර්ස් ආයතනය වන අතර රුපියල් 55,000.00ක මුදලට ආපනශාලා බදු දී ඇත්තේ රන්මල් කේටර්ස් ආයතනයට වේ. ඒ අනුව සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති ආයතනයන්හට සුගතදාස අධිකාරිය විසින් ආපනශාලා බදු දී නොමැත. තවද ලංසු ලේඛනවල දිනවල පරස්පරතාවයක්ද නොමැත.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය.

(අ) පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ආ) සේවා අවශ්‍යතාවය මත සේවකයින් රාජකාරියෙහි යොදවා ඇති නමුත් අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කර නොමැත. නව තනතුරු අනුමත කර ගැනීමට යෝජිත සේවක ව්‍යුහය සකසා මේ වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

(ඇ) නිවැරදි කිරීමට කටයුතු සකසමින් සිටී.

(ඈ) සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) තනතුර දරන නිළධාරියා සපුරා ඇති සුදුසුකම්වලට අනුව සුදුසු තනතුරට පත්කිරීමට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාමාර්ග ගැනීමට නියමිත වේ. මූලික සුදුසුකම් සනාථ නොවූ ක්‍රීඩා නිළධාරීන් 03 දෙනෙකුගේ සේවය අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදි.

4.8 පාඩු හා හානි.

(අ) අකුණු සන්නායකය අතුරුදන්වීම සම්බන්ධව ක්‍රීඩා අමාත්‍යාංශ නිළධාරීන් විසින් මූලික විමර්ශනයක් පවත්වා, අදාල වාර්තාව කළමනාකාරීත්ව මණ්ඩලයට යොමු කර සිදුවී ඇති අලාභය ඇස්තමේන්තුගත කිරීමට කටයුතු කරන ලෙස දැන්වීමෙන් අනතුරුව ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ආ) දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට එකතුකළ අගය මත බදුවල මුල් පිටපත් යවා තිබූ අතර ඒ සඳහා සකසා ඇති විස්තරාත්මක විශ්ලේෂණයන්ද යවා ඇත. නමුත් මේ වන තුරු කිහිපවරක් සිහිකැඳවීම් කර තිබුණද දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් පිළිතුරක් ලබා දී නැත. එබැවින් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අදාල ගෙවිය යුතු එකතුකළ අගය මත බදු මුදල පිළිබඳ අවසන් තක්සේරුවකට පැමිණ නැත. දඩ මුදල් Wave Off කිරීම සඳහා ලිපි කිහිපයක් මගින් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට දන්වා ඇත.

5.1 අභ්‍යන්තර විගණනය.

- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයේ සේවය කළ අභ්‍යන්තර විගණක නිළධාරීතුමිය 2013.05.30 දින සේවයෙන් ඉල්ලා අස් වී ඇත. ඉන්පසු වර්තමාන වැඩ කටයුතු අලුත පත්වීම් ලද අභ්‍යන්තර විගණක නිළධාරීතුමිය විසින් එතැන් සිට සිදුකර ඇත. 2013 හා 2014 වර්ෂ සඳහා සකස් කළ අභ්‍යන්තර විගණක සැලැස්ම අධිකාරියට ප්‍රමාණවත් නොවන බවට විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම්වලදී එම කමිටුව විසින් පෙන්වා දෙන ලදී. එබැවින් 2013 වර්ෂයට අදාලව සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් සකස් කරන ලද අභ්‍යන්තර විගණන ක්‍රියාත්මක සැලැස්ම මත පදනම් කරගෙන සැලැසුම්කළ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත්තේ මේ සියලු කටයුතු සිදුකිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රමාණවත් පිරිස් පහසුකම් නොමැති වීමයි.
- 2017.01.05 වෙනි දින පැවැති විගණන හා කලමනාකරණ කමිටු රැස්වීමේදී අභ්‍යන්තර විගණන අංශයේ සේවක ඌනතාවය හා කාර්යභාරය යටතේ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් රාජකාරියේ යොදවා නොමැති බැවින් විගණන හා කලමනාකරණ කමිටුව අපේක්ෂා කරනු ලබන සේවාවන් එම අංශයෙන් ලබාගත නොහැකි බව ප්‍රකාශ කරන ලදී.
- ඉදිරියේදී පුරප්පාඩු වී තිබූ කළමනාකරණ සහකාර තනතුරු සඳහා 06 දෙනෙකු බඳවාගනු ලබන බවත් එයින් දෙදෙනෙකු අභ්‍යන්තර විගණන අංශය සඳහා යොමුකල හැකි බවට පාලන අධිකාරියේ මතය විය.
- පුරප්පාඩුව පැවැති කළමනාකරණ සහකාර තනතුරු 06 සඳහා සම්මුඛ පරීක්ෂණ මගින් සේවකයින් 06 දෙනෙකු බඳවා ගෙන දැනට ඉන් එක් කළමනාකරණ සහකාරවරයෙකු 2017.04.03 වෙනි දින සිට මෙම අංශයට ලබා දී ඇත.
- 2016.10.08 වෙනි දින සිට මෙම අධිකාරියේ වර්තමාන අභ්‍යන්තර විගණක නිළධාරිනිය ප්‍රසූත නිවාඩු ලබා ඇති බැවින් දැනට කළමනාකරණ සහකාරවරයෙකු හා අනියුක්ත නිළධාරිනියක් හා කාර්යාල කාර්ය සහායකවරයෙකු පමණක් මෙම අංශයේ සේවයේ නියුතුව සිටින ලදී.
- නව පත්වීම්ලාභියාද එක්ව ක්‍රීඩා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක නිළධාරී මහතාගේ උපදෙස් හා සහාය ලබා ගනිමින් අභ්‍යන්තර විගණන ක්‍රියාත්මක සැලැස්ම සංශෝධනය කර නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකර ඇත.

5.2 අයවැය ලේඛනමය පාලනය.

- තත්‍ය ආදායම් හා සමග සැසඳීමේ ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබුණත් අධිකාරිය දීර්ඝ කාලයක් තුළ අලාබ ලැබීම හේතුවෙන් එකවරම නිසි ප්‍රතිඵල ලබා ගැනීමට කාලයක් ගතවනු ඇත. තවද ගෘහස්ථ, එළිමහන් හා බෝගම්බර ක්‍රීඩාංගන වසර 25කින් පමණ අලුත්වැඩියා කර නොතිබීමෙන් වැඩි ආදායමක් ලැබීමට නොහැකි වී ඇත. වර්තමානයේදී එම ක්‍රීඩාංගන අලුත්වැඩියා කරමින් පවතින අතර පිරිවැය පාලනය කිරීම සඳහා කළමනාකාරීත්ව මණ්ඩලය සහය දෙමින් සිටී.

5.3 ක්‍රියාකාරී සැලැස්ම.

- මේ වන විට නිසි ආකාරයට ඉටු කරගෙන යනු ලබයි.

6. පද්ධති හා පාලනයන්.

- ක්‍රියා මාර්ග ගෙන ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
තැ පෙ 2211 ආතර් ද සිල්වා මාවත
කොළඹ 13

ගෘහස්ථ ක්‍රීඩාංගනය : 0112 445 677 / 2 384 490 / 2 384 385
එළිමහන් ක්‍රීඩාංගනය : 0112 423 333
ෆැක්ස් : 0112 445 675
ඊමේල් : chairmansnsca@yahoo.com / sugathadasaindoor@gmail.com

බෝගම්බර ක්‍රීඩාංගනය : 0812 235 395
නුවරඑළිය තුරගතරග පිටිය : 0522 222 659
බෙලිඅත්ත පිහිණුම් තටාකය : 0472 251 685